# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,480 — 1965 අගෝස්තු 13 වැනි සිකුරාදා — 1965.8.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (II) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු | 1037 | පොලිස් වෛද්‍ය හා වෙනත් වෛද්‍ය නිකුත්කිරීම් | 1064 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් | — |
| වෙන්ඩර් කැඳවීමේ දැන්වීම් | 1043 | රට සිම් සිකීම්මේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ වෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් | — |
| ඔප්පුකිරීරුදිය නිකුත්කිරීම් | 1063 | විවිධ දැන්වීම් | 1068 |



## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ශෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස්පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩදෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුලව පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන් ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත්වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

**සංලක්ෂ්‍යය.**—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

**අයැදුම්කරුවන්ට උපදෙස් :**

10. ආධුනිකත්ව සඳහා අයැදුම්පත් මෙහි පහත සඳහන් 20 වන ඡේදයේ දැක්වෙන ආකෘතියේ පිටපතක ලියා ගුවන් හමුදාධිපති, තැ. පෙ. 594, කොළඹ යන ලිපිනයට 1965 සැප්තැම්බර් 11 වෙනි සෙනසුරාදා දවල් 12 ට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයැදුම්පත බහාලන කවරයේ "අයැදුම්පත කාර්මික ආධුනිකත්ව" යනුවෙන් සඳහන් කළ යුතුයි.

11. අයැදුම්පත සමග චරිත සහතික දෙකක්ද එවිය යුතුයි. ඉන් එකක් අයැදුම්කරු පුද්ගලික වශයෙන් පසුගිය අවුරුද්ද තුල හඳුනන වයස්ගත වගකිවයුතු පුද්ගලයෙකුගෙන් විය යුතුයි. අනිත් එක අයැදුම්කරු අවසාන වරට ගිය පාසැලේ ප්‍රධානාචාර්ය තුමාගෙන් විය යුතුය. එහි අයැදුම්කරු විසින් ලබා ගන්නා ලද අධ්‍යාපන සහ ක්‍රීඩා පිළිබඳ සුදුසුකම් සඳහන් වී තිබිය යුතුයි.

12. තෝරා ගැනීමේ මණ්ඩලය මගින් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වනු ලැබේ. නියමිත දිනයක, වේලාවක සහ ස්ථානයක කොළඹ දී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට අපේක්ෂකයින් පෙනී සිටිය යුතුයි. මේ සඳහා ලංකා රජයෙන් ගමන් වියදම් හෝ අන් කිසි වියදමක් නොගෙවනු ලැබේ.

13. අයැදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මෙහි පහත සඳහන් 20 වන ඡේදයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගනු ලබන අයැදුම් පත් වලය. අයැදුම්පත් මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවයන්ට සෑම අතින්ම අනුකූල විය යුතුයි. නැතහොත් ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14. අයැදුම්කරුවෙකුගේ ඉල්ලුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කර තිබෙන බව ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණ හොත් ඒ හේතුවෙන්ම ඔහු තනතුරට නුසුදුසු කෙනෙක් බවට පත් කරනු ලැබීමටත්, තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් රජයේ සේවයෙන් නෙරපනු ලැබීමටත් ඉඩ තිබේ.

15. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් සිය අයැදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. අයැදුම්කරු තෝරාගනු ලැබුවහොත් එම දෙපාර්තමේන්තුවේ සේවයෙන් මුදහැරීමට පුළුවන්ද නැද්ද යන බව ඔහු විසින් සඳහන් කළ යුතුය.

16. අයැදුම්කරුවන් සිය අයැදුම්පත් සමග මෙහි පහත සඳහන් ලිය කියවිලි වල පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතික පත්‍ර හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරන ලද සහතික පත් භාරගනු නොලැබේ.)

(ii) ලබාගත් උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය, සහ

(iii) ඉහත සඳහන් II වෙනි ඡේදයේ සඳහන් කර ඇති චරිත සහතික.

සැලකිය යුතුයි.—මෙම සහතික පත්‍රවල සහ චරිත සහතික පත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කළයුත්තේ අයැදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුව හොත් එම අවස්ථාවේ පමණක්ය.

17. යම්කිසි අපේක්ෂකයෙක් ගැන නිර්දේශ කිරීමට යමෙකුට උවමනා නම් එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට චරිත සහතිකයක් දීමෙනි. යම්කිසි අපේක්ෂකයෙකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑමකට උත්සාහ කරනු ලැබුව හොත් ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුස්සකු බවට පත් වන්නේය.

**තෝරාගනු ලබන පිළිවෙල :**

18. ගුවන් හමුදා මූලස්ථානයේ රැස්වෙන තෝරා ගැනීමේ මණ්ඩලයක් මගින්, ලැබී ඇති අයැදුම්පත් අතුරින් සුදුසු අයැදුම්පත් පළමුවෙන් තෝරා ගනු ලබති. එසේ තෝරාගනු ලබන අපේක්ෂකයින් මූලික පරීක්ෂණයකින් සහ වෛද්‍ය පරීක්ෂණයකින්ද සමත්විය යුතුය.

19. අවශ්‍ය සුදුසුකම් ඇති අපේක්ෂකයින් අතුරින් ආධුනිකත්වය සඳහා අවසන් වරට අපේක්ෂකයින් තෝරාගනු ලබන්නේ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර ඇමති තුමා විසින් පත් කෙරෙන මණ්ඩලයක් මගිනි.

20. අයැදුම්පත.—අයැදුම්පතේ සියළුම කොටු ප්‍රවේසමෙන් පිරවිය යුතු අතර එම කොටුවල හැකිතරම් විස්තර දැක්විය යුතුය.

**කාර්මික ඉංජිනේරු ශාඛාවේ ආධුනිකත්වයක් සඳහා අයැදුම් පත**

## "අ" පුද්ගලික විස්තර

1. අගට යෙදෙන නම :———.
   සෙසු නම් :———.
2. දැනට ලිපිනය :———.
   දුර කථන අංකය :———.
   ළඟුරු දුම්රිය පොල :———.
   පොලිස් ස්ථානය :———.
   විදුලි පණිවුඩ කාර්යාලය :———.
3. ස්ථිර පදිංචිය :———.
   එහි පදිංචි වී සිටි කාලය :———.
4. විවාහක තත්ත්වය :———.
5. ආගම :———.
6. මවපියන්ගේ විස්තර (දේශීයතාව ලබාගෙන තිබේ නම් සහතික පත්‍රයේ අංකය සහ දිනයද සඳහන් කරන්න) :———.
   (අ) පියාගේ නම :———.
   උපන් ස්ථානය :———.
   උත්පත්තියෙන් පුරවැසි භාවය :———.
   (ආ) මවගේ නම :———.
   උපන් ස්ථානය :———.
   උත්පත්තියෙන් පුරවැසි භාවය :———.
7. පියාගේ රැකියාව :———.
8. පාසැල් හා විශ්ව විද්‍යාල චරියාව :———.
   පාසැලේ සහ/හෝ විශ්ව විද්‍යාලයේ නම :———.
   දිනය :———. සමර්ථවී ඇති ප්‍රසිද්ධ විභාගය :———.
   ඇතුල්වූ දිනය :———. අස්වූ දිනය :———.
9. පාසැලෙන් අස්වූ පසු නියුක්තව සිටි රැකියාවල් :———.
   ස්වාමියාගේ නම :———.
   රැකියාවේ ස්වභාවය :———.
   සේවා කාලය :———වෙනිදා සිට ———වෙනි දා දක්වා.
10. මීට පෙර යුෂ්මතා සන්නද්ධ සේවයක යම්කිසි පුරප්පාඩුවක් සඳහා අයැදුම් කළේද? (එසේ නම් සේවයේ නම සහ අයැදුම් කළ තනතුරු වල නම් සහ දිනයන්ද සඳහන් කරන්න) :———.
11. සිවිල් උසාවියකින් හෝ හමුදා උසාවියකින් යුෂ්මතාගේ ඇහ බැඳ තිබේද? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

## "ආ" අවශ්‍ය සුදුසුකම්

(මෙම නිවේදනයේ 2 වන ඡේදයේ සඳහන් අයුරු)

12. උපන් දිනය :———. වයස :———.
    උපන් ස්ථානය :——— උත්පත්තියෙන් ජාතිය :———.
    දැනට :———.
13. සුදුසුකම් (මෙම නිවේදනයේ 2 (ඇ) ඡේදයේ කුමන වගන්තියක් යටතේ ඔබ සුදුසුකම් ලබා තිබේද කියා සඳහන් කරන්න. ඒ කෙසේද කියාත් සඳහන් කරන්න. විභාගවල දිනයන් විෂයයන් සහ විභාග පවත්වනු ලැබුවේ කුමන ආයතන හෝ දෙපාර්තමේන්තු මගින්ද යන බවත් සඳහන් කරන්න) :———.
14. උස :———. පපුව :———.

## "ඇ" අතිරේක සුදුසුකම්

(මෙහි පහත සඳහන් වගන්ති වලට සපයන පිළිතුරු ඔප්පු කිරීමට අයැදුම් කරුවන්ට පුළුවන්කම තිබිය යුතුයි).

15. ක්‍රීඩාවන්හි ඇති දක්ෂතාවය පිළිබඳ විස්තර (කණ්ඩායම් සහ තරඟ විස්තර සඳහන් කර ලබාගත් දක්ෂතාවයද සඳහන් කරන්න) :———
16. පාසැලේ දී, විශ්ව විද්‍යාලයේදී හෝ ඉන් පිටස්තර ආයතනයන්හිදී වෙනත් සැලකිය යුතු දක්ෂතාවයන් ලබාගෙන තිබේ ද? (දිනයන් සහිතව විස්තර සඳහන් කරන්න) :———.
17. නිත්‍ය සන්නද්ධ සේවයක, ස්වේච්ඡා හමුදාවක හෝ බාලදක්ෂ ආයතනයක කලින් සේවය කර තිබේද? (එසේ නම්, සේවයේ හෝ ආයතනයේ නම සඳහන් කර එහි දැරූ උසස්ම තනතුර සහ සේවා කාලය ද සඳහන් කරන්න) :———.
18. තනතුර සඳහා විශේෂ සුදුසුකමක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර.—(උදා. ඉන්ජිනේරු කර්මාන්තය පිළිබඳ පාඨමාලාවන් හදාරා තිබේද? එසේ නම් දින සහිතව විස්තර සඳහන් කරන්න) :———.

## "ඈ" චරිත සහතික

(මෙම නිවේදනයේ 11 වැනි ඡේදය සම්බන්ධවයි)

19. විස්තර :—

| නම | තනතුර | දැනට ලිපිනය |
|---|---|---|
| | | |

"ඉ" ප්‍රකාශයක්

20. ඉහත සඳහන් ප්‍රශ්න වලට මා විසින් සපයා ඇති පිළිතුරු මගේ දැනීමේ සහ විශ්වාසයේ හැටියට සත්‍ය බව දිවුරා ප්‍රකාශ කරමි. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකර තිබෙන පරිදි ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් ඇති ක්‍රියා මාර්ගය සහ ඔවුන්ට බලපාන නීති රීතිද මා විසින් කියවා තෝරා ගන්නා ලදී.

———————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————,

21. අයදුම්කරුගේ මව්පිය/භාරකරු විසින් අත්සන් තැබිය යුතු ප්‍රකාශය:

(අ) රාජකීය ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වය සඳහා ඉල්ලුම්කර ඇත්තාවූද, ඉහත සඳහන් අයදුම් පතේ 20 වන කොටුවේ ඇති ප්‍රකාශයට අත්සන් තබා ඇත්තාවූද ............................නමැති අයගේ මව්පිය/භාරකරු මම වෙමි.

(ආ) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා තෝරාගනු ලැබුව හොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වගකීම මම බාරගන්නා බවට මෙයින් දන්වමි:—

(i) පුහුණුව ලබන කාලය තුල ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන් ඉල්ලා අස්වූ විට එම අයදුම්කරු වෙනුවෙන් එම අවස්ථාව දක්වා ලංකා රජයට දැරීමට සිදුවූ සියලුම වියදම් ලංකා රජයට ආපසු ගෙවීමට.

(ii) ඉහත නම සඳහන් අයදුම්කරු (නරක හැසිරීම නිසා හෝ උවමනානම් ඔහුට වලකාගත හැකි වෙනත් දුර්වලකම් හේතුකොට ගෙන) අධිකාරි බලතල පැවරීමට නුසුදුසු යයි නිලධාරීන් විසින් පැමිණිලි කරනු ලැබුව හොත් එවිට ඔහු වෙනුවෙන් ලංකා රජයට දැරීමට සිදුවූ සියලුම වියදම් ආපසු ලංකා රජයට ගෙවීමට.

———————,
මව්පිය හෝ/භාරකරුගේ අත්සන.

දිනය :———————,

නම (පැහැදිලි අකුරෙන්) :———————

ලිපිනය :———————

සාක්ෂිකරුගේ අත්සන :———————

නම (පැහැදිලි අකුරෙන්) :———————

ලිපිනය :———————

ඊ. ආර්. අමරසේකර,
ගුවන් කොමදෝරු,
ගුවන් හමුදාධිපති.

ගුවන් හමුද මූලස්ථානය,
තැ. පෙ. 594,
කොළඹ.

8-314—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## වාණිජ දෙපාර්තමේන්තුව

### පුස්තකාලයාධිපති තනතුර

වාණිජ දෙපාර්තමේන්තුවේ පුස්තකාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙල කරන ලද අයදුම්පත් 1965 අගෝස්තු මස 28 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය :** වර්ෂයකට රු. 2,820—120×9 සහ 180×4—රු. 4,620. වර්ෂයකට රු. 3,900ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

3. **බඳවා ගැනීමේ කොන්දේසි :** මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම් :**

(i) ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6ක් ඇතිව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්ව තිබිය යුතුය.

(ii) වයස අවුරුදු 30ට අඩු නොවිය යුතු අතර අවුරුදු 40ට නොවැඩිවිය යුතුය;

(iii) පුස්තකාලයාධිපති කටයුතු ගැන පළපුරුද්දක් තිබිය යුතුය.

5. **සේවා කොන්දේසි :**

(අ) තෝරා ගනු ලබන අයදුම්කරු පළමුව අවුරුදු 3ක ආධුනික කාලයකට යටත්ව පත්කරනු ලැබේ;

(ආ) ඔහු රජයේ භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන්ට යටත් වේ.

6. අයදුම්කරුගේ චරිතය සම්බන්ධයෙන් සහ මෙම තනතුරට සුදුසුකම් දැක්වෙන මෑතදී ලබාගත් සහතික 2ක පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

7. අයදුම්පත් ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ 3, තැ. පෙ. 1507, වාණිජ දෙපාර්තමේන්තුවේ, වාණිජ අධ්‍යක්ෂ වෙත එවිය යුතුය. එම අයදුම්පත් දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික ලිපිනයට නොඑවිය යුතුය. ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "පුස්තකාලයාධිපති තනතුර" කියා සඳහන් කළ යුතුය.

8. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් විසින් එවනු ලබන ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයා මගින් ඉදිරිපත් කළ යුතුය. එම ඉල්ලුම්පත් නියමිත දිනයෙන් පසුව මා වෙත ලැබුණොත් ඒවා භාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තු ප්‍රධානයාට ලැබී තිබුණා නම් එසේම ඒවා ප්‍රමාදවීමට සෑහෙන හේතු දක්වමින් එම අයදුම්පත් භාර ගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානයා නිර්දේශ කලහොත් පමණි.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
වාණිජ අධ්‍යක්ෂ.

1965 අගෝස්තු මස 7 වැනි දින,
කොළඹ 3,
වාණිජ දෙපාර්තමේන්තුවේ දී ය.

## වාණිජ දෙපාර්තමේන්තුව

### පුස්තකාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———————.

2. ලිපිනය :———————.

3. වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :———————.

4. ජාතිය :———————.

5. විවාහකද අවිවාහකද යන වග :———————.

6. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) :———————.

7. පුස්තකාලයාධිපති කටයුතු පිළිබඳ පළපුරුද්ද (සහතික පිටපත් ඇමිණිය යුතුය) :———————.

8. අධ්‍යාපනය ලැබූ ආයතන :———————.

9. පාසලින් අස් වූ දිනයේ සිට කළ රක්ෂා හා සේවාවන් පිළිබඳ විස්තර :———————.

10. දැනට දරණ තනතුර හා වැටුප :———————.

11. චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් (පිටපත් ඇමිණිය යුතුය) :
1. ———————.
2. ———————.

මෙම අයදුම්පතෙහි දැක්වෙන සියළුම තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මම සහතික කරමි. මෙහි සඳහන් කිසිම කරුණක් අසත්‍ය හෝ වැරදි සහගත බැව් තෝරා ගැනීමට පෙර එළිදරව් වුවහොත් මා මේ තනතුර සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව එළිදරව් වුවහොත්, කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහකර දැමීමට ඉඩකඩ ඇති බවත් මම දනිමි.

———————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————.

8-408—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාම යෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදු වන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ අවශ්‍යතාවන් හා අයදුම් පතේ මුද්‍රිත උපදෙස් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නො කෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම් පත් 1965.8.31 වැනි දින පස්වරු 4.30ට හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ, " සිරිමතිපායේ " අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ සචිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්වවිද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් ද එවිය යුතුයි. අයදුම්කරුවන් සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවත්, මේ අවශ්‍යතාව සපුරාලිය යුතු ය.

16. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ සචිර ලේකම්.

1965 අගෝස්තු මස 7 වැනිදා,
කොළඹ 3, " සිරිමතිපායේ ",
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

8–418—65.8.13 අංක 14,480 දරණ ගැසට් පත්‍රය

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## කොළඹ වරාය කොමිෂන් සභාව

ජනසතු සේවා අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1965 ඔක්තෝබර් මස 20 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට පෝක් ලිෆ්ට් ට්‍රක්ස් 10 ක් සහ දොඹකර 8 ක් සපයා බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1965 ඔක්තෝබර් මස 20 වෙනිදා පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 200 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් හා රු. 25 ක මුදලක් ලියකියවිලි ගාස්තු වශයෙන් වරාය කොමිෂන් සභා කාර්යාලයේදී තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව රු. 200 ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ලියකියවිලි ගාස්තු වශයෙන් තැන්පත් කරන රු. 25 ආපසු ගෙවනු නොලැබේ.

3. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1965 ඔක්තෝබර් මස 18 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

4. අවලංගු කරන ලද ටෙන්ඩර් ලියකියවිලි හෝ විස්තර සටහන් පත්‍රිකා නිකුත් කරනු නොලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1965.8.13 දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදීය.

8–274—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

## රාජකීය ලංකා නාවික හමුදාව

### කරෙයිනගර්හි රා. ලං. එලාර ආයතනයේ විදුලි සංඥා මධ්‍යස්ථානයක් ගොඩනැංවීම

1. කරෙයිනගර්හි රා. ලං. එලාර ආයතනයේ විදුලි සංඥා මධ්‍යස්ථානයක් ගොඩනැංවීම සඳහා නාවික හමුදාධිපති 1965 අගෝස්තු මස 31 වන දින පූ. භා. 11 දක්වා ටෙන්ඩර් බාර ගනු ලැබේ.

2. කොළඹ, නාවික හමුදා මූලස්ථානයේදී නාවික හමුදාධිපතිගෙන් ඉල්ලුම් පත්‍ර ලබාගත පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. වැඩි විස්තර සිවිල් ඉංජිනේරු නැත, රාජකීය ලංකා නාවික හමුදාව, ත්‍රිකුණාමලය; නාවික හමුදා මූලස්ථානය, කොළඹ හා අණදෙන නිලධාරි, රා. ලං. එලාර ආයතනය කරෙයිනගර් ගෙන් ලබා ගත හැකි අතර ඔවුන්ගේ කාර්යාල වලින් ගොඩනැගිලි සැලැස්ම පරීක්ෂා කළ හැක.

3. රුපියල් 10,000 දක්වා රජයේ දෙපාර්තමේන්තුවල ගොඩනැගිලි සෑදීම සඳහා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ටෙන්ඩර් ඉල්ලුම් කිරීමට සුදුසු වේ. මෙම ලියාපදිංචි කිරීම් ඔප්පු කිරීමෙන් මෙම දෙපාර්තමේන්තුවේ කොළඹ නාවික හමුද මූලස්ථානයේ හා ත්‍රිකුණාමලයේ ගණකාධිකාරි වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25 තැන්පත් කර ලදු පතක් ලබාගෙන ඉදිරිපත් කළ විට ටෙන්ඩර් සඳහා ඉල්ලුම් පත්‍ර නිකුත් කරනු ලැබේ. කොන්ත්‍රාත්තුව අත්සන් කළාට පසු සියලුම තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

4. පහත සඳහන් අය ටෙන්ඩර් තැන්පත් මුදල් බැඳීමෙන් නිදහස් කෙරේ :—

(අ) සමුපකාර තොග වෙළෙඳ ආයතනය.

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් පිළිගත් ග්‍රාම සංවර්ධන සමිති ; හා

(ඇ) සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. 1965 අගෝස්තු 28 වනදා දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

නාවික හමුදාධිපති වෙනුවට.

මූලස්ථානය,
රාජකීය ලංකා නාවික හමුදාව,
තැ. පෙ. 593
කොළඹ.
1965 අගෝස්තු 3 වන දා.

8–404—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

## රාජකීය ලංකා නාවික හමුදාව

### කරෙයිනගාර්හි නැව් පාලමක් සෑදීම

1965.9.15 දින පෙරවරු 9.30 දක්වා රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් කරෙයිනගාර්හි නැව් පාලමක් සෑදීම සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. රුපියල් 2,00,000ක් හා ඊට වඩා වටිනා කාර්‍යයන් සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිව සිටින කොන්ත්‍රාත්කරුවන් එසේ ලියාපදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කළායින් පසුව එකී ටෙන්ඩර්කරුවන්ට පමණක් ටෙන්ඩර ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. පහත අත්සන් කර ඇති අයගෙන් අයදුම් කිරීමෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් තවදුරටත් විස්තර දැනගත හැක.

4. ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිකුත් කිරීමට පෙර, සෑම ටෙන්ඩරයක් සඳහාම රාජකීය ලංකා නාවික හමුද මූලස්ථානයේ රුපියල් 250ක ඇප මුදලක් තැන්පත් කළ යුතුය. කොන්ත්‍රාත්තුව අත්සන් කළායින් පසුව සියලුම ඇප මුදල් ආපසු ගෙවනු ලැබේ.

ආර්. කදිර්ගාමර්,
කොමදෝරු,
නාවික හමුදාධිපති.

කොළඹ,
මූලස්ථානය,
රාජකීය ලංකා නාවික හමුදාව,
තැ. පෙ. 593, කොළඹ.

8–265—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

1965 ඔක්තෝබර් 1 වැනිදා සිට 1966 සැප්තැම්බර් 30 වෙනි දින දක්වා කාලය තුළදී අම්බලන්ගොඩ මාදම්පේ කාර්මික බඩු ගබඩාවේ සිට 5,00,000 ක් පමණ ලුණු මලු අම්බලන්ගොඩ දුම්රිය ස්ථානයට පටවාගෙන ගොස් භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 සැප්තැම්බර් මස 3 වෙනි දින පෙරවරු 10 දක්වා ම විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර සහ වෙනත් විස්තර කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටි ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් හෝ ගාල්ල කච්චේරියේ සිටින ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක නිලධාරි තැනගෙන් හෝ අම්බලන්ගොඩ මාදම්පේ කාර්මික බඩු ගබඩාවෙන් හෝ ලබාගත හැකිය.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත
අධ්‍යක්ෂ.

1965 අගෝස්තු මස 4 වෙනි දින,
කොළඹ 7,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව.

8-323—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කැක්කපල්ලියේ බලවේග පෙහෙ කම්හල් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා සවදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 65.9.8 දින පෙ. ව. 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර බාර ගනු ලැබේ.

2. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ රු. 28,000 කට හෝ ඊට වැඩි ගෙඩනැගිලි වැඩ සඳහා හෝ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවනට මේයට සහභාගී විය හැක.

3. මෙයට සහභාගී වීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 50 ක ඇප මුදලක් මේ කාර්යාලයේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කර 65.9.4 දින දහවල් 12ට ප්‍රථම කුවිතාන්සිය ඉදිරිපත් කර ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පැමිණිය හැක. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන්නේ 65.9.8 දින පෙ. ව. 9.30 ට සවදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කාර්යාලයේදී ය.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත වැඩ
බලන අධ්‍යක්ෂ.

1965 අගෝස්තු 7 දින,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දී ය.

8-363—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## මීගමුවේ තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස පාසැලට අමු ද්‍රව්‍යයන් සැපයුම 1965/66

පහත අත්සන් කරනු ලබන මවිසින් මීගමුව, තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස පාසැලට1965 66 මුදල් වසර තුළ පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයුම සඳහාවූ ටෙන්ඩර් පත් 1965 සැප්තැම්බර් මස 3 වැනිද පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණයි.

3. මේ ටෙන්ඩරයන් සඳහා ටෙන්ඩර් හා ආරක්ෂණ තැන්පත් මුදල් පහත සඳහන් පරිදි විය යුතු යැයි තීරණය කොට ඇත:—

| | ටෙන්ඩර් පත් ලබාගැනීම සඳහා තැන්පත් කළයුතු මුදල | | | ඇපමුදල | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| (අ) මුස්න හා ඉදල් තැණීමට යෝග්‍ය මිටි ... | 25 | 0 | ... | 300 | 0 |
| (ආ) නො. 1 පීරපු පොල් කොහු ... | 25 | 0 | ... | 200 | 0 |
| (ඉ) වියලි පොල් ඉරටු ... ... | 25 | 0 | ... | 200 | 0 |
| (ඊ) මාදම්පා වේවැල් ... ... | 25 | 0 | ... | 200 | 0 |

4. ඉහත සඳහන් ද්‍රව්‍යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කෙරේ නම් ඒ වෙනුවෙන් ආදර්ශක (සැම්පල්) ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය සඳහන් කොට පහත අත්සන් කරනු ලබන අයගේ කාර්යාලයේ තැන්පත් කළ යුතුය. ආදර්ශක නොමැති ටෙන්ඩර් පත් ප්‍රතික්ෂෙප කරනු ඇත.

5. පහත සඳහන් ආයතනයන් සඳහා නියමිත ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේදී ආපසු ගෙවන තැන්පත් ඇප මුදල් අවශ්‍ය නොවේ :—

(1) සමුපකාර තොග වෙළඳ ආයතනය,

(2) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන,

(3) ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂක විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති, සහ

(4) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ත්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

6. ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුත්තේ ඒ සඳහාම නියමිත පෝර්මයන් මගින් පමණකි. එය ලබාගත හැක්කේ 1965 සැප්තැම්බර් 2 වැනිද පස්වරු 2 දක්වා පමණක් පිළිගනු ලබන ඉහත සඳහන් ද්‍රව්‍යයන් සඳහා වෙන වෙනම සඳහන්කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් බවත්, මේ ටෙන්ඩර් තැන්පත් මුදල් කොළඹ 9 බන්ධනාගාර කොමසාරිස් කාර්යාලයේදීත්, කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කල හැකි බවත්, මින් සලකවනු ලැබේ.

7. ටෙන්ඩර් පත්‍රයන් සීල් තැබූ කවරයන්හි බහා එහි වම්පස කෙළවරේ "..........සැපයුම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන්කොට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ පහත් අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ කළ හැකිය.

8. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයන්හි අකුරෙන් හා ඉලක්කම්වලින් දක්විය යුතුය. එසේ අකුරින් හා ඉලක්කම්වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීමක් හෝ අමුතු එක් කිරීම් ඇතුළත් කළහොත් ඒ බව ටෙන්ඩර් කරුවන් විසින්ම අත්සන් යොද සැබෑ බව සහතික කළ යුතුය.

9. වර්ෂ 1965 සැප්තැම්බර් 3 වැනි දින පෙරවැරු 10.35 ට පහත අත්සන් කරන ලද අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට පුලුවන.

10. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂෙප කිරීමේ හා කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක නවතාලීමේ සම්පූර්ණ අයිතිය මීගමුවේ තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස පාසැලේ අධිකාරි වෙත පැවරී ඇත.

11. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකිවූ කොන්ත්‍රාත්කරු ඒ බව දන්වා එවූ විට දින 10 ක් ඇතුළත දී මීගමුවේ තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස පාසැලේ අධිකාරි සමග ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. එම කාලසීමාව තුළදී කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර් කරු අපොහොසත්වුනි නම් එම කාලසීමාව තුළදී ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක කොට ඔහුගේ නම හා ලිපිනය වගකීම් පැහැර හරින කොන්ත්‍රාත් කරුවන්ගේ නාමාවලියෙහි ඇතුළත් කරනු ඇත.

12. තවත් වැඩි විස්තර දනගැනීමට අවැසිනම්, පහත අත්සන් කරන අයගෙන් එය ලබා ගත හැකිය.

ඊ. ඇම්. ද. පොන්සේකා
තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස පාසැලේ වැ.බ. අධිකාරි,
මීගමුව.

1965 අගෝස්තු මස 13 වැනි දින,
මීගමුවේ තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස පාසැලේදීය.

8-385—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

## දැන්වීමයි

### ත්‍රිකුණාමලේදී "යූලූ" නැමැති යාත්‍රාව විකිණීම

ත්‍රිකුණාමල වරායේ රේගු තටාකය අසල නැංගුරම් දමා ඇති "යූලූ" නැමැති රුවල් යාත්‍රාව මිලයට ගැනීම සඳහා මුද්‍රිත ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

යාත්‍රාවේ බර ටොන් 6.79කි. ලියාපදිංචි කර ඇත්තේ හොංකොං වරායේය.

යාත්‍රාව ත්‍රිකුණාමලයේදී පරීක්ෂා කර බලත හැක. මෙම යාත්‍රාව පරීක්ෂා කිරීමට රිසි අයෙක්, ත්‍රිකුණාමලේ රේගු අයකැමි සහ කැඩුණු නැව් භාරගන්නාතැනගෙන් ඉල්ලුම් කළ යුතුය. 65.8.27 දින පෙරවරු 9.30 දක්වා ත්‍රිකුණාමල කච්චේරියේදී ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරනු ලැබේ.

1965.8.27 දින පෙ. ව. 10.30ට ටෙන්ඩර් පත්‍ර දිසාපති කාර්යාලයේදී විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට ඉඩදෙනු ඇත.

ත්‍රිකුණාමලේ ඇතුල් වරාය පාරේ පිහිටි උප රේගු අයකැමිතුමාගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරම පත්‍රයක් මත ටෙන්ඩර් භාර දිය යුතුය. එක් එක් පෝරම පත්‍රය සඳහා රු. 100ක මුදලක් තැන්පත් කළ යුතුය. මෙම මුදල විකිණීම හමාරවූ විට ආපසු ගෙවනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර පැහැදිලිව ලියා, සියලුම වෙනස් කිරීම් අත්සන් කොට, සහතික කළ යුතුය.

ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ "'යූලූ' යාත්‍රාව මිලට ගැනීම සඳහා" යනුවෙන් ලියා ත්‍රිකුණාමලේ රේගු අයකැමි සහ කැඩුණු නැව් භාර ගන්නාතැන වෙත එවිය යුතුය.

ටෙන්ඩර් පත්‍ර ත්‍රිකුණාමල කච්චේරියේ, මේ සඳහා තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

ටෙන්ඩර් මිල යාත්‍රාව සඳහා ගෙවිය යුතු රේගු ගාස්තුද ඇතුළත් බැව් ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ.

පිළිගත් ටෙන්ඩරය අයිතිකරු ඒ බැව් දන්වූ සතියක් ඇතුළත මුදල් ගෙවා යාත්‍රාව භාර ගත යුතුය. එසේ නොකළහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කර යාත්‍රාව නැවත විකිණීම ත්‍රිකුණාමලයේ රේගු අයකැමිතුමාට හා කැඩුණු නැව් භාර ගන්නාතැනට, තම අදහස පරිදි කළ හැක.

කිසි හේතුවක් නොදී, යම් ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර නොපිළිගැනීමේ අයිතිය රේගු අයකැමි සහ කැඩුණු නැව් භාර ගන්නාතැන තබා ගනියි.

ඇම්. බී. සේනානායක,
රේගු අයකැමි සහ කැඩුණු නැව් භාරගන්නාතැන.

මගේ අංකය: වී. ආර්. සී. 440.
රේගුව, ත්‍රිකුණාමලය,
1965 අගෝස්තු 2 වෙනි ද.

8-1349—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### කළුතර උප කොට්ඨාශය

කළුතර උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1965 සැප්තැම්බර් 7 වන අඟහරුවාද පෙරවරු 11 දක්වා, කොළඹ 5, ජාවත්ත පාරේ, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලෙම එහිදී සිදු කෙරේ:—

| වැඩයේ නම | ලියා පදිංචි වී තිබිය යුතු ගණන | | ටෙන්ඩර් තැන්පත් මුදල | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| 1. රත්මලේ පිහිටි උඩුකුඹුර අමුණ තැනීම ... | ... 28,000 | 0 ... | 50 | 0 |
| 2. ඔලබොඩුව අමුණ තැනීම ... | ... 26,000 | 0 ... | 50 | 0 |
| 3. නිකවුඇල-තෝරගල ඇල සු. ග. වැ. ව්‍යාපාරය සංවර්ධනය කිරීම ... | ... 20,000 | 0 ... | 25 | 0 |
| 4. දෙඩම්පාපිටිය අමුණ ව්‍යාපාරය සංවර්ධනය කිරීම ... | ... 18,000 | 0 ... | 25 | 0 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණන් වලට හෝ ඊට වැඩි ගණන් වලට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1965 සැප්තැම්බර් 6 වන සඳුද පස්වරු 1 තෙක් (එදින ඇතුළුව) කළුතර/කොළඹ/ගම්පහ/රත්නපුර වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයන් ගෙන් ලබාගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට කරන වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට, ප්‍රථම මෙම වැඩ සඳහා ඉහත දක්වෙන අයුරු ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනු වෙන් ලබා ගත් කුවිතාන්සිය 1965 සැප්තැම්බර් 6 වන දින පස්වරු 1 දක්වා හෝ ඊට පෙර දිනවල කාර්යාල වේලාවන් තුළදී ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩ ගැන වැඩි විස්තර, සැලසුම් යනාදිය කාර්යාල වේලාවන් හිදී කළුතර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

ජේ. ගුණසේකර,
වාරිමාර්ග ඉංජිනේරු,
කළුතර උප කොට්ඨාශය.

කළුතර, 1965.8.4.

8-290—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍ර වැව් කණ්ඩි පාරට කැටගල් දමා තාර ඇමීම සඳහා ටෙන්ඩර් පොළොන්නරුවේ ඊශාන කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු විසින් 1965 සැප්තැම්බර් මස 7 වෙනිදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 42,000ක් හෝ ඊට වැඩි ගණනක් වටිනා කොන්ත්‍රාත් වැඩ වෙනුවෙන් ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ට විවිධ සේවා සමුපකාර සමිති හා වෙනත් සමිතිවලට පමණක් මෙම වැඩය උදෙසා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකිය.

3. 1965 සැප්තැම්බර් මස 3 වෙනි දා පස්වරු 4.30 දක්වා පොළොන්නරුව මින්නේරිය හෝ කවුඩුල්ල වාරිමාර්ග ඉංජිනේරු ගෙන් ලබාගත් පෝර්මයන්හි දෙපිටපත් සහිතව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම ඉල්ලීමේදී කොන්ත්‍රාත් කරුගේ ලියාපදිංචි රෙකෝඩ් පොත, දැනට කරගෙනයනු ලබන වැඩවල විස්තරයක් හා එම වැඩ භාර නිලධාරීන්ගෙන් වැඩවල ප්‍රගතිය පිළිබඳ සහතිකයක්ද ඉදිරිපත් කළ යුතුයි. මෙම ලිපිය ලැබීමෙන් පසු ටෙන්ඩර් පෝර්මයක් නිකුත් කළයුතුද නැද්ද යන්න වාරිමාර්ග ඉංජිනේරු තීරණය කරනු ඇත.

4. මේ සඳහා අවශ්‍ය ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් 50ක් වන අතර එය වාරිමාර්ග අධ්‍යක්ෂතුමා නමින් ගත් මුදල් ඇණවුමකින් ගෙවිය හැක. නොඑසේනම් කොළඹ හැර වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩර් නිකුත් කරන වාරිමාර්ග ඉංජිනේරුට ඉදිරිපත් කළ හැකිය.

5. වැඩි විස්තර කාර්යාල වේලාවන්හිදී ටෙන්ඩර් අවසානවන දිනය දක්වා පොළොන්නරුවේ වාරිමාර්ග ඉංජිනේරුගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

පී. සන්මුගනාදන්,
වාරිමාර්ග ඉංජිනේරු,
පොළොන්නරුව උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
පොළොන්නරුව, 1965.8.6.

8-403—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

**කොළඹ මහරෝහලේ අලුත් ශල්‍යාගාර ගොඩනැගිල්ලේ හෘදයවස්තු ශල්‍යාගාරය, කලුවර කාමරය, ඡායාරූප ශබ්ධාව, වායුසමනය කිරීම**

ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1965 ක්වූ ඔක්තෝබර් මස 12 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 500, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්ය ලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්ද රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන්ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර, ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් පෝර්ම වලයි. වර්ෂ 1965 ක්වූ ඔක්තෝබර් මස 8 වන දින අ. භා. 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1965 ක්වූ ඔක්තෝබර් මස 12 වන අඟහරුවාදා පූ. භා. 10 ට ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ නො. 355 හේ කාමරයේ පිහිටි ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පෙනී සිටීමට අවසර ඇත.

ඈස්. ඩබ්ලිව්. පීරිස්,
වැඩ බලන විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540, කොළඹ 10,
1965ක්වූ අගෝස්තු මස 13 දින දී ය.

8–356—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

**මහජන මන්ත්‍රී මණ්ඩලය අලුත් ක්‍රමයට වායු සමනය කිරීම**

ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1965ක්වූ ඔක්තෝබර් මස 12 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 500, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරුතැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන්ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් පෝර්ම වලයි. වර්ෂ 1965ක්වූ ඔක්තෝබර් මස 8 වන දින අ. භා. 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1965ක්වූ ඔක්තෝබර් මස 12 වන අඟහරුවාදා පූ. භා. 10 ට ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ නො. 355 හේ කාමරයේ පිහිටි ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පෙනී සිටීමට අවසර ඇත.

ඈස්. ඩබ්ලිව්. පීරිස්,
වැඩ බලන විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකාරතැන.

තැ. පෙ. 540, කොළඹ 10.
1965ක්වූ අගෝස්තු මස 13 වැනි දින දීය.

8–321—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් තිස්ස උප කොටසේවූ පහත සඳහන් වැඩ සඳහා වෙන් වෙන් වශයෙන් වූ ටෙන්ඩර් පත්, 1965, සැප්තැම්බර් මස 14 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා, දකුණු කොට්ඨාශය භාර, තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

| වැඩ විස්තර | කොන්ත්‍රාත්කරු ලියා පදිංචි තිබිය යුතු මුදල රු. ශ. | | අවශ්‍ය ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|---|
| 1. ලූකස්ගොඩ පාරට නැවත ගල් හා තාර දැමීම. 2 වෙනි හැතැප්ම ... | 35,000 0 | ... | 50 0 |
| 2. ලූකස්ගොඩ පාරට නැවත ගල් හා තාර දැමීම. 3 වෙනි හා 4 වෙනි හැතැප්මයන්. (4 වෙනි හැතැප්ම අඩි 1,150 පමණි.) ... | 40,000 0 | ... | 50 0 |
| 3. ගහ බඩ පාරට නැවත ගල් හා තාර දැමීම. 1 වෙනි හැතැප්ම. ... | 30,000 0 | ... | 50 0 |
| 4. ගහ බඩ පාරට නැවත ගල් හා තාර දැමීම. 2 වෙනි හා 3 වෙනි හැතැප්මයන්. (3 වෙනි හැතැප්ම අඩි 400ක් පමණි.) ... | 31,000 0 | ... | 5 00 |

ඉහත සඳහන් ගණන්වලට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1965 සැප්තැම්බර් මස 9 වෙනි දින තෙක් එදිනද ඇතුළුව කායඝාල වේලාවන් තුළදී, තිස්ස, හම්බන්තොට හා ගාල්ල යන වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කායඝාලවලින් ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන්, ඔවුන්ගේ ලියාපදිංචි පොත් හා දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න ගැන සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ෆෝර්ම නිකුත් කරනු ලැබීමට ප්‍රථම, ඉහත දක්වා ඇති පරිදි එක්එක් වැඩය වෙනුවෙන් රු. 50ක ටෙන්ඩර් ඇප මුදලක්, වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඝාලයෙන් හෝ ඕනෑම කච්චේරියක තැන්පත්කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

මෙම ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, කායඝාල වේලාවන් තුළදී තිස්ස උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඇන්. ගුරුසාමි,
තිස්ස උප කොටස භාර
වාරිමාර්ග ඉංජිනේරු තැන.

1965 අගෝස්තු මස 4 වෙනි දින,
තිස්ස, වාරිමාර්ග කායඝාලයේදීය.

8–387—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—ගාල්ල කොට්ඨාශය

### කිරි නොමැති පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1965 ඔක්තෝබර් 1 වනද සිට 1966 සැප්තැම්බර් 30 වනද දක්වා දින (දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැති පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව සහ පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩර්යක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට භාරදෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි " සී " උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදියයුතු ද වන්නේ ය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

අයි. ඒ. සිරිවර්ධන,
වැඩබලන සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල.

1965 අගෝස්තු 2 වැනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදීය.

### උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
| | | | | සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය සහ වේලාව | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු |
| | රුපියල් | රුපියල් | | | | | | | | | |
| බද්දේගම ගැමි රෝහල සහ මාතෘ නිවාසය ... | 100 | ...800 | 7.9.65 පෙ.ව. 10 ට | 100 ... | 100 ... | 100 ... | 400 ... | 1,250... | 1,300... | 1,250... | 5,100 |
| හික්කඩුව ගැමි රෝහල සහ මාතෘ නිවාසය ... | 100 | ...600 | 7.9.65 පෙ.ව. 10 ට | 200 ... | 150 ... | 200 ... | 750 ... | 850... | 850... | 900... | 3,450 |
| ඉඳුරුව ගැමි රෝහල සහ මාතෘ නිවාසය ... | 100 | ...600 | 7.9.65 පෙ.ව. 10 ට | 200 ... | 200 ... | 200 ... | 750 ... | 700... | 700... | 650... | 2,750 |

8-289/1—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වනදා සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනිදා දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට දුම්රිය ස්ථානවල, සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථානවලට එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විසතර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—එහා මෙහා ගෙන යා යුතු පිරිසිදු එළකිරි ප්‍රමාණයන් දල වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙලවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කල යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ ලේකම්, ගණකාධිකාරී මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමේ හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු ම විසින් නියම කරන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතු ද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැන ගැනීම සඳහා මෙහි දෙවන ඡෙදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මඟින් පුළුවන.

1965 අගෝස්තු මස 2 වැනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදීය.

අයි. ඒ. සිරිවර්ධන,
ගාල්ලේ වැඩබලන සෞඛ්‍ය සේවා අධිකාරී.

### උපලේඛනය

| (1) සේවය | (1) ප්‍රදේශය | (2) ප්‍රමාණය පයින්ට් | (3) අවසාන දිනය |
|---|---|---|---|
| බද්දේගම සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කාර්යාලයේ සිට බද්දේගම සෞඛ්‍ය කාර්යාල භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... ... | බද්දේගම ... | 12,895 ... | 7. 9. 65 |

8–289/2—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—ගාලු දිස්ත්‍රික්කය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1965 ඔක්තෝබර් 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් ද, ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතු යි.

3. වත්කමේ විස්තර.—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතු යි. මේ සඳහා වූවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වූවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමිවන්නට ඉඩ තිබේ.

4. සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. ටෙන්ඩර් පත් එවිය යුතු අන්දම.—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක්ද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩරකරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වූවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. තැන්පත් ඇප මුදල්.—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේ ය.

11. අනික් විස්තර.—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) කිළිටු රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම්.—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙන යාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වූවමනා නම් කොටසක් හෝ සැම කොටසක් ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

1965 අගෝස්තු මස 2 වැනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ය.

අයි. ඒ. සිරිවර්ධන,
වැඩබලන සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. | (3) ඇප මුදල රු. ශ. | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු කැලි ගණන සාමාන්‍ය | (6) ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| (II) වෙනි කොටස.—ඇක්ස්රේ සහ කායික වෛද්‍ය අංශයන්, ලේබැංකුව, රෝග නිරෝධායන පරීක්ෂණාගාරය, මුළු තැන්ගෙය, ප්‍රවේශ කාර්යාලය, අනියම් ලෙඩුන්ගේ කාමරය, බාහිර ලෙඩුන් අංශය, දන්ත, ඇස්, කණ, නාසය, උගුර පිළිබඳ සහ වෙනත් චිකිත්සාගාර, රෝහල් පොලිසි මුළුව, බෙහෙත් හල, අදින කාමරය සහ ඕවර්සියර් ... | 50 0 ... | 100 0 ... | 4 ... | 1,300 ... | 7. 9. 65 පෙරවරු 10.00ට |

8-289/3—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : එෆ්.ටී.බී. 38/65.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### නික්ෂේපන සඳහා වතුර ආදිය සැපයීම

මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනට නික්ෂේපන සඳහා වතුර ආදිය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965.11.16 වෙනි අඟහරුවාද උදේ 10 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුවේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ඩීන්ස් පාරේ, අංක 355 දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශයෙන්) ලබාගත හැක. මෙම දැන්වීමේ 5 වැනි, 6 වැනි ඡෙදයන්හි සඳහන් කරුණු අනුව 1965.11.15 වෙනි සඳුද උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් සීල් තබන ලද කවරයක බහා, සභාපතිතැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ. පෙ. 500, පළමුවෙනි මහළ, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලු මුවදොර, කොළඹ යන ලිපිනයට එවිය යුතුවේ. සීල් තබන ලද ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ " නික්ෂේපන සඳහා වතුර ආදිය—1965.11.16 උදේ 10 " ට යනුවෙන් සඳහන් කළ යුතුවේ.

4. ටෙන්ඩර්පත් ගාලු මුවදෙර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාමර අංක 155 හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර්කරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍යයයි හැඟේ නම් සීල් තබන ලද ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උප ලේකම්තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීමද කළ හැක. එසේ බාරදෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහාද යන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුවේ. එම ටෙන්ඩර් පත් බාර ගැනීම සඳහා ඉහත කී නිලධාරිතැනට බලය ඇත. සීල් තබන ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්තවරයෙකු බව සහතික කළ යුතුවේ. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතුවේ.)

6. 1955 ඔක්තෝබර් 28 වෙනි දින අංක 10,854 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් අයුරු, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1949 සහ අංක 25 දරණ ආහාර සහ ඖෂධ පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව, ඖෂධ විකිණීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගෙන් ලබාගත් වලංගු බලපත්‍රයක් ඇති බලයලත් වෙළඳුන්ගෙන් පමණක් මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්මේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහාණ්ඩුව, චෙකොස්ලොවේකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගොස්ලේවියාව. වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව ආදි රටවල්වලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් වෙතොත්, ඔවුන් ලියා පදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තෝ විය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේ දී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතුවේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වැනි ඡේදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීමේ අංශය) ලබාගත හැක. මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිත කළ හැක්කේ ස්වදේශීය ටෙන්ඩර්කරුවන්ට පමණි.

8. මෙහි පළමුවැනි ඡේදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2ක් වත් විවෘතව තැබිය යුතුයි.

9. කෙලින් ම ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිෂ්පාදන මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියලුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකා ආණ්ඩුවේ නියෝජිතයින්ගෙන් ලබාගත හැකි බව දැන්විය යුතුවේ. මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්ථානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, හන්ගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාල දිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාව, බොම්බායේ සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නිහි සිටින ලංකා වෙළඳ කොමසාරිස් හා ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයින්ගෙන්.

10. ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරන ටෙන්ඩර් කොන්දේසිවල II වැනි ඡේදය කෙරෙහි ටෙන්ඩර්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. කොළඹ රජයේ බෙහෙත් ගබඩා අධිකාරින්ට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධව විස්තර එම ඡේදයෙහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුයි. ටෙන්ඩර් පත් සමාප්ත කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැළකිල්ලට භාජනය කරනු නොලැබේ.

11. මෙහි I වැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර්කරුවෙකුට ම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් එහි පැමිණ සිටි ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුන ටෙන්ඩරයක් පරීක්ෂාකර බැලීමට යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ.

12. ටෙන්ඩර්කරුවන් තමන්ගේ මිල ඉදිරිපත් කිරීම්වල රුපියලේ මෙරට වටිනාකමත්, විදේශීය විනිමය වටිනාකමත් වෙන වෙනම සෑම විෂය අංකයක් වෙනුවෙන් සඳහන් කළ යුතුය.

ඇස්. බාලක්‍රිෂ්ණන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ,
1965 අගෝස්තු 9 වැනි දින.

## උපලේඛනය

| විෂය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතා | අවශ්‍ය ඇසිරීම |
|---|---|---|---|
| 1. | බී.පී. නික්ෂේපනය සඳහා වතුර (ඇක්වා ප්‍රො නික්ෂේපනය) 10සිසි ... | ඇම්පියුල 40,00,000 ... | ඇම්පියුල 100 යේ පෙට්ටි තුළ |
| 2. | මෙතොක්සමින් හයිඩ්රොක්ලොරයිඩ් බී.පී.සී. 1963 නික්ෂේපනය—සෑම සී.සී. එකකම මිලිග්‍රෑම් 20 ක් අඩංගු නහරගත හා මාංශගත යන දෙයාකාරය වම ප්‍රයෝජනයට සුදුසු සහ එසේ ලේබල් කළ යුතු ... ... | 1,50,000 × 1 සිසි ඇම්පියුල ... | ඇම්පියුල 25 හේ පෙට්ටි තුළ |
| 3. | ඇමිනොෆිලින් බී.පී. නික්ෂේපනය සෑම ඇම්පියුලයකම මිලිග්‍රෑම් 250 ක් අඩංගු සිසි 10 යේ ඇමිනොෆිලින් (ඉන්ට්‍රාවීනස්) නහරගත ප්‍රයෝජනයට සුදුසු වන හා එසේ ලේබල් කර තිබිය යුතුය ... ... | 1,50,000 × 10සිසි ඇම්පියුල ... | ඇම්පියුල 50හේ පෙට්ටි තුළ |
| 4. | ගැලොමයින් ත්‍රිතියොඩයිඩ් බී.පී. 4% 3 සිසි වලින් ... ... | 20,000 ඇම්පියුල ... | එම |
| 5. | සක්සිනිල් කෝලයින් ක්ලෝරයිඩ් (සක්සමෙතෝනියම් ක්ලෝරයිඩ්) බී.පී. නික්ෂේපනය මිලි ග්‍රෑම් 100, 2 සිසි වලින් ... ... | 40,000 ඇම්පියුල ... | එම |
| 6. | කෝටිසෝන් ඇසිටේට් බී.පී. නික්ෂේපනය 20 සිසි (මිලිග්‍රෑම් 25 ක් එක සිසි එකක් තුළ) (ඉන්ට්‍රාමැස්කුල) මාංශගත නික්ෂේපනය සඳහා ... | 25,000 කුප්පි ... | කුප්පි 100 යේ පෙට්ටි තුළ |
| 7. | (ඒ) ක්ලොරෝක්වින් සල්ෆේට් බී.පී. 0.2 ග්‍රෑම් හෝ ; (බී) ක්ලොරෝක්වින් ෆොස්පේට් 0.25 ග්‍රෑම් සෑම පෙත්තකම 0.15 ග්‍රෑම් ක්ලොරෝක්වින් බේස් අඩංගු විය යුතුය ... ... ... | 10,00,000 පෙති ... | පෙති 1,000 හේ බෝතල් තුළ |
| 8. | සෙට්‍රිමයිඩ් බී.පී. කුඩු ... ... ... ... | 1,800 × 500 ග්‍රෑම්ස් (ශුද්ධ) ටින්... | පහසු ආකාරයක ඇසිරීමක් |
| 9. | මර්සලිල් බී.පී. නික්ෂේපනය 1 සිසි ... ... ... | 3,50,000 ඇම්පියුල. ... | ඇම්පියුල 100 පෙට්ටි තුළ |
| 10. | එලික්සියර් ඔෆ් පිපරේසින් සිට්‍රේට් (බී.පී.සී. 1963) ; ශක්තිය :—එලික්සියර් මිලි ලීටර්ස් 4 ක් (60 මිනිම්ස්) පිපරේසින් හයිඩ්‍රේට් මිලි ග්‍රෑම් 500 කට සමානව අඩංගු විය යුතුයි. (ලේබලය මෙම ශක්ති ප්‍රමාණය පැහැදිලිව දැක්විය යුතුය.) ... ... ... ... | 10,000 ඉම්පීරියල් ගැලුම් සනත්වයෙන් | ගැලුම් බාගයේ විදුරු බෝතල් තුළ |

**බාරදීමේ ක්‍රමය.**—මෙහි අංක 1 සිට 10 දක්වා වූ විෂයන් ඉතා කිට්ටු සමාන තොග 2කින් කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් බාර දිය යුතු වෙයි. පළමු වෙනි තොගය ඇනයුම් කළ දින සිට මාස 3ක් ඇතුළත ද ඉතිරි තොගය ඉන්පසු එවන මාස 3 කින් ද සැපයිය යුතුවේ.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම්, මෙම සැපයීමේ ඇහිරීම් සහ අනිකුත් සියළුම ගාස්තු සහිතව සඳහන් කරන ලද මිල ගණන සහ කොළඹට ගෙනාර්මේ ගාස්තු සහිත මිළ බෙහෙත් නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් ද සඳහන් කළ යුතු වෙයි. නාවික මාරු කිරීම්වලට ඉඩ දෙනු නොලැබේ.

මෙම සැපයීමේ සියළුම විෂයන් සහ ඒවා බහා එවන සෑම භාජනයකම '' ඔටුන්න ලකුණ '' සහ '' සි–සිඑම්එස් 2629/65–66 '' යනුවෙන් සඳහන්ව තිබිය යුතුය.

**8–333—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.**

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### රජයේ බෙහෙත් ගබඩාවේ පාවිච්චි කළ නොහැකි අංක 33 ශ්‍රී 858 දරණ ෆෝක්ස්වැගන් රථය විකිණීම

පාවිච්චි කළ නොහැකි අංක 33 ශ්‍රී 858 දරණ ෆෝක්ස්වැගන් වෑන් රථය මිළයට ගැනීම සඳහා වර්ෂ 1965 ක්වූ අගෝස්තු මස 28 වන දින දහවල් 12 දක්වා කොළඹ රජයේ බෙහෙත් ගබඩාධිකාරි විසින් ටෙන්ඩර් අයදුම් පත්‍ර බාර ගනු ලැබේ.

සෙනසුරාදා හැර සතියේ අනිකුත් වැඩ කරන දිනයන්හි පූ. භා. 9 සිට අ. භා. 4.30 දක්වා වූ කාර්යාල වේලාවන් තුළ මරදානේ ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන පිහිටි රජයේ බෙහෙත් ගබඩාවේදී මෙම රථය පරීක්ෂා කළ හැක.

ටෙන්ඩර්කරුවන් තමන් විසින්ම සකස් කළ ෆෝර්මයන්හි පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත්‍ර කවරයන්හී බහා සීල් තබා, කවරයේ වම්පස උඩ කෙළවරේ "පාවිච්චි කළ නොහැකි අංක 33 ශ්‍රී 858 දරණ වෑන් රථය මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කළ යුතුය.

මරදානේ ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන රජයේ බෙහෙත් ගබඩාධිකාරි වෙත මුදලින් රුපියල් 100 ක් තැන්පත් කොට, ටෙන්ඩර් පත්‍රයට එකී මුදල සඳහා නිකුත් කළ රිසිට් පත ඇමිණිය යුතුය.

පළමුවන ඡේදයේ සඳහන් දිනයෙහි නියමිත වේලාවට පෙර, එකී ටෙන්ඩර් පත්‍ර මාගේ කාර්යාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය. නැතහොත්, ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

කිසිම ප්‍රශ්නයකට යටත් නොවී ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමට සහ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් බාර ගැනීමේ අයිතිය ආණ්ඩුව වෙත පවරා ගෙන ඇත.

මෙම දැන්වීමේ සඳහන් කොන්දේසිවලට අනුකූල නොවූ ටෙන්ඩර් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

ඉදිරිපත් කළ මිළ ගණන්, පිළි ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින්, එකී ටෙන්ඩරය පිළිගත් දින සිට දින 7 ක් ඇතුළතදී සම්පූර්ණයෙන් රජයේ බෙහෙත් ගබඩාධිකාරි වෙත ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා දින 3ක් ඇතුළතදී රථය රජයේ බෙහෙත් ගබඩා භූමියෙන් ඉවතට ගෙන යා යුතුය.

8 වන ඡේදයේ අඩංගු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වුව හොත්, තැන්පත් ටෙන්ඩර් ගාස්තුව රජය සතුවනු ඇත.

අවශ්‍ය වන වැඩි දුර විස්තර මරදානේ ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන රජයේ බෙහෙත් ගබඩාධිකාරිගෙන් ලබා ගත හැක.

ඩී. ඒ. ඒ. මුණසිංහ,
රජයේ බෙහෙත් ගබඩාවේ අධිකාරී.

1965 අගෝස්තු මස 2 වනදා,
කොළඹ.

8-280—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

යොමු අංකය : එෆ්. ටී. ඊ. 45/65.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### එක්ස්-රේ සේයාපටි සහ රසායනික ද්‍රව්‍ය සැපයීම

මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතැනට එක්ස්-රේ සේයාපටි සහ රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1965 ඔක්තෝබර් 12 වෙනි අඟහරුවාද උදේ 10 දක්වා බාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ගාලු මුවදොර පිහිටි මහ ලේකම් ගොඩනැගිල්ලේ '' බී '' අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතැනගේ කාර්යාලයෙන් ( කොන්ත්‍රාත් සහ සැපයීම් අංශයෙන්) ලබාගත හැක. මෙම දැන්වීමේ 5 වැනි, 6 වැනි ඡේදයන්හි සඳහන් කරුණු අනුව 1965 ඔක්තෝබර් 11 වෙනි සඳුදා උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත් සීල් තබන ලද කවරයක බහා, සභාපතිතැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශය, තැ. පෙ. 500, පළමුවෙනි මහළ, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලු මුවදොර, කොළඹ ලිපිනයට එවිය යුතු වේ. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ '' එක්ස්-රේ සේයාපටි සහ රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්—1965.10.12 උදේ 10ට ''යනුවෙන් සඳහන් කළ යුතු වේ.

4. ටෙන්ඩර් පත් ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ, කාමර අංක 155 හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍යයයි හැඟේනම් සීල් තබන ලද ටෙන්ඩර් පත් සෞඛ්‍ය හා නිවාස අමාත්‍යාංශයේ උප ලේකම්තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීම ද කළ හැක. එසේ බාරදෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහා ද යන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පාහැදිලිව සඳහන් කළ යුතු වේ. එම ටෙන්ඩර් පත් බාර ගැනීම සඳහා ඉහතකී නිලධාරිතැනට බලය ඇත. සීල් තබන ලද ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුව ද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්තවරයෙකු බව සහතික කළ යුතු වේ. (මේ සඳහා නියෝජිත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතු වේ.)

6. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්බේනියාව, ඔස්ට්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහ ආණ්ඩුව, චෙකොස්ලොවේකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යූගෝස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව ආදී රටවල්වලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් වෙතොත්, ඔවුන් ලියාපදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලකතැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තෝ විය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේදී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතු වේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වැනි ඡේදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙනි (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශය) ලබාගත හැක. මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිත කළ හැක්කේ ස්වදේශීය ටෙන්ඩර්කරුවන්ට පමණි.

8. මෙහි පළමුවැනි ඡේදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2ක්වත් විවෘතව තැබිය යුතුයි.

9. කෙලින්ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිෂ්පාදක මූලිකම්රුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි උපලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියලුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකාණ්ඩුවේ නියෝජිතයින්ගෙන් ලබාගත හැකි බව දන්විය යුතු වේ. මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්තානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම, හන්ගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාල දිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාව, බොම්බායේ සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නිහි සිටින ලංකා වෙළඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයින්ගෙන්.

10. ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරන ටෙන්ඩර් කොන්දේසිවල II වැනි ඡේදය කෙරෙහි ටෙන්ඩර්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. කොළඹ රජයේ බෙහෙත් ගබඩා අධිකාරිනට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධව විස්තර එම ඡේදයෙහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නො කළ යුතුයි.

ටෙන්ඩර් පත් සමාප්ත කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැළකිල්ලට භාජනය කරනු නොලැබේ.

11. මෙහි 1 වැනි ඡෙදයේ සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර්කරුවෙකු වම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් එහි පැමිණි සිටි ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුන ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

ආස්. බාලක්‍රිෂ්ණන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ. 1965 ජූලි 20 දින.

## උපලේඛනය

| විෂය අංක | වර්ගය | ඇස්තමේන්තු කරන ලද අවශ්‍ය ප්‍රමාණය | අවශ්‍ය ඇහිරීම |
|---|---|---|---|
| 1. | ඩුප්ලිටයිස්ඩ් ඇක්ස්-රේ සේයාපටි ප්‍රමාණය 17″ × 14″ ... | පැකට් 1,920 ... | හුළං නොවදින ටින්වල අසුරන ලද උෂ්ණ දේශගුණයට ඔරොත්තු දෙන අයුරු ඇහිරීම; ටින් එකක සේයාපටි 25 හේ පැකට්වලින් |
| 2. | ඩුප්ලිටයිස්ඩ් ඇක්ස්-රේ සේයාපටි—ප්‍රමාණය 15″ × 12″ ... | පැකට් 21,600 ... | එම |
| 3. | ඩුප්ලිටයිස්ඩ් ඇක්ස්-රේ සේයාපටි—ප්‍රමාණය 12″ × 10″ ... | පැකට් 10,080 ... | එම |
| 4. | ඩුප්ලිටයිස්ඩ් ඇක්ස්-රේ සේයාපටි—ප්‍රමාණය 10″ × 8″ ... | පැකට් 3,240 ... | එම |
| 5. | ඩුප්ලිටයිස්ඩ් ඇක්ස්-රේ සේයාපටි—ප්‍රමාණය 15″ × 6″ ... | පැකට් 792 ... | එම |
| 6. | ඩුප්ලිටයිස්ඩ් ඇක්ස්-රේ සේයාපටි—ප්‍රමාණය 14″ × 14″ ... | පැකට් 1,500 ... | එම |
| 7. | ඩෙන්ටල් ඇක්ස්-රේ රේඩියටයිස්ඩ් සේයාපටි—1¼″ × 1⅝″ ... | පැකට් 940 ... | එම |
| 8. | ඩුප්ලිටයිස්ඩ් ඔකුල්සල් ඩෙන්ටල් ඇක්ස්-රේ සේයාපටි—ප්‍රමාණය 3″ × 2¼″ | පැකට් 940 | එම—පටි 25 හේ පැකට්වලින් |
| 9. | ඇක්ස්-රේ ඩිවැලොපර් ... ... | ටින් 1,680 ... | ගැලොම් 4 රේ ටින්වලින් උෂ්ණ දේශගුණයට ඔරොත්තු දෙන අයුරු |
| 9(ඒ) | ඇක්ස්-රේ සවිකරන කට්ටල—හාඩ්නර් එක සමග ... | ටින් 1,680 ... | එම |
| 9(බී) | ඇක්ස්-රේ රිපැලැනිෂර් ... ... | ටින් 3,600 ... | ගැලොම් 1කේ ටින්වලින් උෂ්ණ දේශගුණයට සරිලන ඇහිරීම |
| 10. | ඇක්ස්-රේ ඉක්මන් ක්‍රියාකාරී ඩිවැලොපර් ... | ටින් 150 ... | ගැලොම් 4රේ ටින්වල උෂ්ණ දේශගුණයට සරිලන ඇහිරීම |
| 10ඒ | ඉක්මන් ක්‍රියාකාරී ෆික්සර් ... ... | ටින් 150 ... | ගැලොම් 4රේ ටින්වල උෂ්ණ දේශගුණයට සරිලන ඇහිරීම |
| 11. | ඇක්ස්-රේ ඩිවැලොපර් ... ... | ටින් 9,000 ... | ගැලොම් 1කේ ටින්වල උෂ්ණ දේශගුණයට සරිලන ඇහිරීම |
| 11ඒ | ඇක්ස්-රේ ඇසිඩ් ෆික්සින් සෝල්ට්—හාඩ්නර් එක සමග ... | ටින් 9,000 ... | එම |
| 12. | මි. මී. 70 ඇම්. ඇම්. ආර්. වොටසර් ඔඩෙල්කා වර්ගයට හිල් මීටර් 3 නොමැති මි. මී. 70 ඔතන ලද ස්කෝපික්ස් ජී. සේයාපටි | රෝල් 4,200 ... | ඕනෑම සුදුසු ඇහිරීම් ක්‍රමයකට උෂ්ණ දේශගුණයට සරිලන ඇහිරීම |
| 13. | මි. මී. 70 ඇම්. ඇම්. ආර්. පිලිප්ස් සඳහා හිල් නොමැති මි. මී. 70 ඔතන ලද ඇක්ස්-රේ සේයාපටි | අඩි 100යේ රෝල් 900 ... | එම |
| 14. | මි. මී. 45 ඇම්. ඇම්. ආර්. පිලිප්ස් වර්ගය. හිල් නොමැති මි. මී. 45 ෆ්ලුරොග්‍රැෆික් සේයාපටි | අඩි 100යේ රෝල් 600 ... | එම |
| 15. | මි. මී. 35 ඇම්. ඇම්. ආර්. කොඩැක් වර්ගයට මි. මී. 35 හිල් නොමැති ෆ්ලුරොග්‍රැෆික් සේයාපටි ඔතන ලද | අඩි 100යේ රෝල් 300 ... | එම |

සැ. යු.—තෝරාගත් ටෙන්ඩර්කරු තමන්ගේ සේයාපටි සකස් කිරීම සඳහා අවශ්‍ය මිශ්‍රණය සෑදීමේ ක්‍රමය ඉදිරිපත් කිරීමේ අවශ්‍ය වේ.

බාරදීමේ ක්‍රමය.—විෂය 1–21 දක්වා ඇති භාණ්ඩ මසකට වරක් බැගින් මාස 12 කදී තොග වශයෙන් කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට සැපයිය යුතු වේ. පළමුවෙනි තොගය ඇනයුම් කළ දින සිට මාස 3 ක් ඇතුලත දී ඉතිරි තොග 11 ද, ඉන්පසු මසකට වරක් බැගින් ද සැපයිය යුතු වේ.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස රජයෙන් ඉල්ලා සිටින්නේ නම්, එම්ම භාණ්ඩවල, ඇහිරීම් සහ අනිකුත් සියළුම ගාස්තු සමග මිල සහ කොළඹට ගෙනවීමේ ගාස්තුව භාණ්ඩ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් ද සඳහන් කළ යුතු වේ. නාවික මාරුකිරීම්වලට ඉඩ දෙනු නොලැබේ. ටෙන්ඩර්කරුවන් විසින්, රුපියලේ වටිනාකම හා විදේශ විනිමය, වටිනාකම වෙන වෙනම, තමන්ගේ මිල ඉදිරිපත් කිරීම්වල සෑම විෂය අංකයක් වෙනුවෙන්ම සඳහන් කළ යුතු වන්නේය.

8–346—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිටිකිරි සහ සීනි එහා මෙහා ගෙනයාම

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.—වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා (දෙදිනම ඇතුලුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට, දුම්රිය ස්ථානවල (සෞඛ්‍ය කාර්යාල වල) ආණ්ඩුවේ ගොවිපොලවල සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (අ) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—රුපියල් 100 ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

(ආ) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, කෑගල්ල, පුත්තලම, රත්නපුරය සහ වවුනියා යන ස්ථානවල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත ආකෘතිපත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. වත්කම් විස්තර.—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූවිට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමග ඇති උපලේඛනයේ 3 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, මාතලේ'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුන බවට නිකුත් කරන ලද කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය යුතුයි.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයෙහි සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකරගැනීමට මා සමග කටයුතු පිළියෙළ කරගැනීම හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිතයකු ගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැක.

8. **ටෙන්ඩරයෙහි සඳහන් මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයේ විශේෂ අවසරයක් නොවේනම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාළය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැනගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් මගින් මාතලේ, සෞඛ්‍ය සේවා අධිකාරිගෙන් විමසන්න.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1965 අගෝස්තු මස 4 වෙනි දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදීය.

## උපලේඛනය

| සේවය | ප්‍රදේශය | මසකට යැවිය හැකි ප්‍රමාණය පයින්ට් | අවසාන දිනය |
|---|---|---|---|
| මාතලේ සෞඛ්‍ය වෛද්‍යනිලධාරිතැනගේ කාර්යාලයේ සිට මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | මාතලේ ... | 5,520 | |
| මාතලේ කිරි මණ්ඩල මධ්‍යස්ථානයේ සිට රත්තොට සෞඛ්‍ය කාර්යාලයට සහ රත්තොට සෞඛ්‍ය කාර්යාලයේ සිට රත්තොට සෞඛ්‍ය කාර්යාල භාර නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... ... | රත්තොට ... | 2,220 | 1965.8.31 පූ.භා. 10ට |
| හිඟුරක්ගොඩ දුම්රිය ස්ථානයේ හෝ පොළොන්නරුව මධ්‍යම සත්ව පර්යේෂණ ස්ථානයේ සිට හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයේ සිට හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට... | හිඟුරක්ගොඩ ... | 5,611 | |

8–334/1—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිටිකිරි සහ සීනි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වෙනිද සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන්වන ආයතනයන්ට, පිටිකිරි දුම්රිය ස්ථානවල (සෞඛ්‍ය කාර්යාලවල) සීනි, සමුපකාර තොග ගබඩාවල සිට සෞඛ්‍ය කාර්යාලවලටද සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථානවලටද ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර මාතලේ සෞඛ්‍ය අධිකාරිතැන විසින් භාර ගනු ලැබේ.

2. (අ) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ආ) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර , මඩකලපුව බදුල්ල, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, කෑගල්ල, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොන ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොකරන අය ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡෙදයෙහි සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු පිටිකිරි සහ සීනි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, මාතලේ'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහනලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමා ම මගේ කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන ඡෙදයේ සඳහන් දිනයන්හි, පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කරගැනීම හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉක්මවන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දන ගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැනගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් මගින් මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරිගෙන් විමසන්න.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1965 අගෝස්තු මස 4 වෙනි දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේ දීය.

### උපලේඛනය

| සේවය | ප්‍රදේශය | දෙමසකට වරක් ගෙනයන ප්‍රමාණය — පිටිකිරි හො. | දෙමසකට වරක් ගෙනයන ප්‍රමාණය — සීනි හො. | අවසාන දිනය |
|---|---|---|---|---|
| මාතලේ දුම්රිය ස්ථානයේ සිට පිටිකිරිද, මාතලේ සමුපකාර බඩු ගබඩාවේ සිට සීනිද, මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්‍යාලයට සහ මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්‍යාලයේ සිට මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... | මාතලේ | ... 21½ | ... 8¼ | 31.8.1965 පූ.භා 10 |
| කදුරුවෙල දුම්රිය ස්ථානයේ සිට පිටිකිරිද, තමන්කඩුව සමුපකාර සංගමයේ සිට සීනිද, හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කාර්‍යාලයට සහ හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කාර්‍යාලයේ සිට හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලටද ... | හිඟුරක්ගොඩ | ... 10¾ | ... 4½ | |
| කැකිරාව දුම්රිය ස්ථානයේ සිට පිටිකිරිද, දඹුල්ල සමුපකාර සංගමයේ සිට සීනිද, දඹුල්ලේ සෞඛ්‍ය කාර්‍යාලයට සහ දඹුල්ලේ සෞඛ්‍ය කාර්‍යාලයේ සිට දඹුල්ලේ සෞඛ්‍ය කාර්‍යාලය භාර නිළධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලටද ... ... ... ... .... | දඹුල්ල | ... 22½ | ... 8 | |
| මාතලේ දුම්රිය ස්ථානයේ සිට පිටිකිරිද, මාතලේ සමුපකාර සංගමයේ සිට සීනිද, රත්තොට සෞඛ්‍යකාර්‍යාලයට සහ රත්තොට සෞඛ්‍ය කාර්‍යාලයේ සිට රත්තොට සෞඛ්‍ය කාර්‍යාලය භාර නිළධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | රත්තොට | ... 31 | ... 12 | |

8–334/2—65. 8. 13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

### රාගම උතුරු කොළඹ මහා රෝහලට දර සැපයීම

1965 ඔක්තෝබර් මස 1 වැනිද සිට 1966 සැප්තැම්බර් මස 30 වැනිදයින් අවසන් වන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමුවැනි තීරයෙහි දක්වා ඇති දර සැපයීම සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ලාංකික යන්ගෙන් හෝ ලාංකික ආයතන වලින් කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලය මගින් සපයන ලද ෆෝර්ම වල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. මේ සමග ඇති උපලේඛනයේ 4 වෙනි තීරයෙහි සඳහන් දිනවල පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරනලද මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර් කරුවකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍යවුවහොත් සෞඛ්‍ය සේවා අධිකාරි හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපතක් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමග ඇති උප ලේඛනයේ දෙවැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රය ලබා ගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුය.

5. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

6. අයදුම්කරුවන් විසින් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර් පත්‍ර නිකුත් කෙරෙන අවසාන දිනට පෙරදින දවල 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය ෆෝර්ම ලබාගත යුතුයි. තැපැලෙන් ෆෝර්ම ඉල්ලුම් කරන අය, මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල්වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය ෆෝර්ම ලබාගත හැකිය.

7. සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු සෞඛ්‍ය සේවා අධිකාරි මෙත දන්විය යුතුයි. ඒ සඳහා අවශ්‍ය ෆෝර්ම එම කාර්යාලවලින් ලබාගත හැක.

8. ටෙන්ඩර් කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිරභාවය පිළිබඳ තොර තුරු දැනගැනීමට ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුය.

9. සෑම ටෙන්ඩරයක්ම ඉහත සඳහන් සෞඛ්‍ය සේවා අධිකාරි තැනගේ නමට එවිය යුතුය. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වමඳස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි. ටෙන්ඩර්පත් එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලේකම්/ගණකාධිකාරිවරයාට පුද්ගලිකව භාරදීමෙන් හෝ එය ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත හැක. ටෙන්ඩර් කරුවන්ට තම ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් එවීමට පුළුවන. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දින පෙරවරු 10 ට පසු තැපෑලෙන් ලැබෙන හෝ පැමිණ භාරදෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. එක් ආයතනයක් සඳහා සැපයිය යුතු දර ප්‍රමාණය දළ වශයෙන් ආයතනය භාර වෛද්‍ය නිළධාරි තුමාගෙන් හෝ එම කාර්යාලයෙන් ලබාගත හැකිය.

11. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය.

12. කිසිම විමසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාර ගැනීමද නැතහොත් සියළුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලයද රජය සතුව ඇත.

13. වැඩි විස්තර මෙම කාර්යාලයට අයදුම්පතක් එවීමෙන් දැනගත හැක.

ඇල්. ආර්. ජේ. වොට්සන්,
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී.

1965 අගෝස්තු මස 4 වැනි දින,
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| රාගම උතුරු කොළඹ මහා රෝහලට දර සැපයීම ... ... | 100 ... | 600 ... | 1965.9.8 දින පෙරවරු 10ට |

8–368—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

සමුපකාර සමිති, ග්‍රාමසංවර්ධන සමිති හා කම්කරු සමිති මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමට ප්‍රථම කොළඹ ප්‍රදේශයේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තුමා වෙත සමුපකාර සංවර්ධන උප කොමසාරිස් තුමා ගෙන් (සමුපකාර සමිති වෙනුවෙන්) හෝ සහකාර කම්කරු කොමසාරිස් තුමා ගෙන් (කම්කරු සමිති වෙනුවෙන්) හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් (ග්‍රාම සංවර්ධන සමිති වෙනුවෙන්) එකී සමිතියට මෙම වැඩය කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුයි. මෙම අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකරන කිසිම අයදුම්කරුවෙකුට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු නො ලැබේ. අමතර විස්තර කොළඹ 7 ග්‍රීන්පාත් හි කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපන කාර්යාලයයේ සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ තුමා ගෙන් ලබා ගත හැක. ටෙන්ඩර් පත්‍ර භාර දීම අපේක්ෂා කරන ඉල්ලුම්කරුවන් අවශ්‍ය විස්තර ලබා ගැනීමට අන්තිම දිනය වන තුරු නො සිට කල්වේලා නො ඉක්මවා එය ලබා ගන්නේ නම් මැනවි.

ඇම්. ඒ. පෙරේරා,
සහකාර අධ්‍යාපනාධ්‍යක්ෂ/කො. ප්‍ර.

ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයය,
ග්‍රීන්පාත්, කොළඹ 7,
1965.8.6.

8-419—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිස්ත්‍රික්කයෙන් සංවර්ධන වැඩ කරවා ගැනීම සඳහා ටැන්ඩර් කැඳවීමයි

පහතින් විස්තර දක්වා ඇති සේවාව සඳහා 1965 සැප්තැම්බර් මස 3 වැනි දින දවල් 12.00 දක්වා වාරිමාර්ග, රජයේ වැඩ, දුම්රිය හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති (රු. 15,000/- දක්වා) කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටැන්ඩර් එදින සවස 3.00 විවෘත කරනු ලැබේ.

**සේවාවන් පිළිබඳ විස්තර**

(1) දෙහිගම්පල් කෝරළේ සහ පාත බුලත්ගම ප්‍රා. ආ/නි කොටසේ පිහිටි වැලිහෙලතැන්න ජනපදයේ ළිඳක් තැනීම.

(2) දෙහිගම්පල් කෝරළේ සහ පාත බුලත්ගම ප්‍රා. ආ/නි කොටසේ පිහිටි හක්බෙල්ලාවක ඉඩම් කට්ටි ඔවර්සියර් නිවාසයට ජලය සැපයීම සහ එහි පඩිපෙළක් බැඳීම.

(3) බෙලිගල්කෝරළේ ගේරගොඩ වසමේ පාළුඹුර ජනපදයට ජලය සැපයීම.

(4) ගල්බොඩ කෝරළේ, කෙරමිණිය ජනපදයේ ළිඳක් තැනීම.

(5) අටුලුගම කෝරළේ නාමල්දෙණිය ජනපදයේ ළිං දෙකක් තැනීම.

මේ පිළිබඳ වැඩි විස්තර දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් දැනගත හැකියි.

2. කෑගල්ලේ දිසාපතිතුමාගෙන් ටැන්ඩර් පත්‍ර ලබාගෙන, ටැන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. ටැන්ඩර් පත්‍ර ඉදිරිපත් කරනු ලබන කවරයේ වම් උඩ කෙලවරේ "......................................." (ඒ ඒ ටෙන්ඩරයේ නම සඳහන් කරන්න) යන්න සඳහන් කර සීල්තබා දිසාපති, කෑගල්ල යන්න එහි ලිපිනය පැහැදිලිව ලියා ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. සියළුම ටැන්ඩර් පත්‍ර අනු පිටපත් සහිතව එවිය යුතු වගද සැලකිය යුතුයි.

3. ටැන්ඩර් පත්‍ර ලේඛනගත තැපෑලෙන් නොඑවතොත්, ටැන්ඩර් කරුවන් හෝ ඔහුගේ නියෝජිතයින් විසින් ඒවා අතින්ම ටැන්ඩර් පත්‍ර දිසාපති වෙත හෝ ඔහුගෙන් බලය ලත් නිලධාරීතුමා වෙත පුද්ගලිකව භාරදිය යුතුයි.

4. ලියාපදිංචි තැපෑලෙන් එවනු ලබන සියලුම ටැන්ඩර් පත්‍ර ලැබුණු බව ටැන්ඩර් පත්‍ර විවෘත කරන දිනයේදීම ටැන්ඩර්කරුවන් වෙත එවනු ලැබේ. යම් ටැන්ඩර් කරුවකු ටැන්ඩර් වසන දිනයේ සිට දින 4 ක් තුළ එවැනි ලිපියක් නොලැබුනහොත්, ඔහු වහාම දිසාපති ගෙන් ඒ ගැන කරුණු විමසිය යුතුයි. එසේ කරුණු විමසීමේදී ටැන්ඩරය පිළිබඳ විස්තරත් ටැන්ඩර්කරුගේ ලිපිනයත්, ටැන්ඩරය ලේඛනගත තැපෑලෙන් යවනු ලැබී නම් එහි ලේඛනගත ලිපියේ අංකයත් දැන්විය යුතුයි.

5. ටැන්ඩර් පත්‍ර භාරගැනීම නැවත්වීමට නියමිත දිනයේ දවල් 11.00 වනතෙක් ටැන්ඩර් පත්‍ර දෙනු ලැබේ. එසේ නිකුත් කරනු ලබන සෑම ටැන්ඩරයක් වෙනුවෙන්ම රු. 25/-ක් කෑගල්ලේ දිසාපතිතුමා නමින් තැන්පත් කර ඒ වගට කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි. මෙසේ ටැන්ඩර් මුදල් තැන්පත් කිරීම ලංකාවේ ඕනෑම දිසාපති කාර්යාලයකදීම කළ හැකියි. තෝරාගනු ලැබූ ටැන්ඩර්කරුවා, එසේ ඔහුගේ ටැන්ඩරය තෝරාගත් වග දන්වා සති තුනක් ඇතුළත, අවශ්‍ය ඇප මුදල් තැන්පත් කර සේවාව සතුටුදායක ලෙස අවසන් කිරීම සඳහා ගිවිසුම් පත්‍ර අත්සන් කළ යුතුයි. එසේ කිරීමට නො හැකි වුවහොත්, ඒ ටැන්ඩර්කරුවාගේ නම වැඩ පැහැර ඇරිය ටැන්ඩර් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කරනු ලැබේ. තෝරා ගනු ලැබුවාවූ ටැන්ඩරයේ වටිනාකමින් 10%ක් ඇප මුදල් ලෙස තැන්පත් කළ යුතුයි. එසේ මුදල් තැන්පත් කිරීම ලංකාවේ සෑම දිසාපති කාර්යාලයකදීම කළ හැකියි.

6. නියමිත ටැන්ඩර් ෆෝර්මයේ ලියා නැති හෝ නියමිත කොන්දේසිවලට පටහැනිව සකස් වී ඇති සියලුම ටැන්ඩර් පත්‍ර, පිළිගත හැකි ටැන්ඩර් පත්‍ර ලෙස සලකනු නොලැබේ. ටැන්ඩරයේ ප්‍රමාණ යන් හා ගණන් ඉතා පැහැදිලිව තීන්තෙන් ලිවිය යුතු අතර එහි යම් වෙනස් කිරීමක් හෝ කැටගෑමක් ඇතිනම් එය ටැන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා වලංගු කළ යුතුයි.

7. ටැන්ඩරයේ ටැන්ඩර්කරුගේ නම හා ලිපිනය ඉතා පැහැදිලිව ලිවිය යුතුයි.

8. යම්කිසි ටැන්ඩරයක් පිලිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ නැතිනම් ටැන්ඩරයකින් කොටසක් පිලිගැනීමේ අයිතිය ටැන්ඩර් මණ්ඩලය වෙත තබාගනු ලැබේ.

9. පත්කරගනු ලැබුවාවූ ටැන්ඩර්කරුවන් එම සේවාව සඳහා "ලාංකික" කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකික" යන වචන යේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් යන්නයි.

10. 1934 රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපණතේ (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරු ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත් කරුවාට භාරදිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් කොන්ත්‍රාත්කරුගේ ලිපිනයට තැපෑලෙන් යැවුවහොත්, එය ඔහුගේ අතටම භාරදුන්නා සේ සැලකිය යුතුයි.

12. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනාකරනු ලබන යම්කිසි සේවකයකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම සේවකයෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුව තබාගනු ලැබේ.

13. වැඩ පැහැරහැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ඇති ලැයිස්තුවට තනිතනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනකු සමග නම ඇතුලත් වූ හෝ ටැන්ඩර් මණ්ඩලය විසින් විරුද්ධ වන කිසිවෙකු හෝ සමග කොන්ත්‍රාත්තුවට බැඳෙනු නො ලැබේ.

14. ටැන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

**15.** මේ පිළිබඳ වැඩි විස්තර කෑගල්ලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් සතියේ වැඩකරන දිනවල උදේ 9.00 සිට සවස 4.30 දක්වා ලබාගත හැකියි.

ඇල්. බී. උඳලාගම,
කෑගල්ලේ වැඩබලන දිසාපති.

1965 අගෝස්තු 7 වැනි දින,
කෑගල්ලේ දිසාපති කාර්යාලයේදිය.

8-382—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## ලංකා වානේ සංස්ථාව

අතුරුගිරියේ, ඔරුවල පිහිටි වානේ වැඩබිමෙහි විදුලි සන්දේශ ස්ථානය තැනීම, සම්පූර්ණ කිරීම හා නඩත්තුව සඳහා ටෙන්ඩර කැඳවනු ලැබේ.

ආපසු නොලැබෙන රුපියල් 50 ගාස්තුවක් ගෙවීමට පසු ප්‍රමාණ බිල් සහ ටෙන්ඩර කොන්දේසි පිටපත් මණ්ඩලයක් ද රූ සටහන් පිටපත් කාණ්ඩයක් ද අතුරුගිරියේ ඔරුවල අප කාර්යාලයෙන් අගෝස්තු 16 වෙනිදායින් පසු ලබා හැක.

1965 අගෝස්තු මස 30 වෙනි දින පූ. භා. 11ට ටෙන්ඩර භාර ගැනීම නතර කරනු ලැබේ.

ටෙන්ඩරකරුවන් රුපියල් 50,000කට නොඅඩු අගය ඇති කොන්ත්‍රාත් සඳහා රජයේ දෙපාර්තමේන්තුවක් සමග හෝ රාජ්‍ය සංස්ථාවක් සමග හෝ ලේඛයාරූඪ අය විය යුතු අතර, මෙම වැඩ ඉටු කිරීම සඳහා ඔවුන්ට ඇති හැකියාව ගැන ඔවුන් සංස්ථාව තෘප්ත කළ යුතුය.

සභාපති,
ලංකා වානේ සංස්ථාව,
අතුරුගිරිය.

8-348/1—65. 8. 13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

## ලංකා වානේ සංස්ථාව

### ටෙන්ඩර් කැඳවීම් දැන්වීමයි

අතුරුගිරියේ, ඔරුවල පිහිටි වානේ වැඩබිමෙහි ස්ථිර සාධන කාමර (වැසිකිළි) ආදිය තැනීම, සම්පූර්ණ කිරීම හා නඩත්තුව සඳහා ටෙන්ඩර කැඳවනු ලැබේ.

ආපසු නොලැබෙන රුපියල් 25 ගාස්තුවක් ගෙවීමට පසු ප්‍රමාණ බිල් සහ ටෙන්ඩර කොන්දේසි පිටපත් දෙකක් ද රූ සටහන් පිටපත් කාණ්ඩයක් ද අතුරුගිරියේ, ඔරුවල අප කාර්යාලයෙන් අගෝස්තු 16 වෙනිදායින් පසු ලබා ගත හැක.

1965 අගෝස්තු 30 වෙනි දින පූ. භා. 11ට ටෙන්ඩර් භාර ගැනීම නතර කරනු ලැබේ.

ටෙන්ඩර්කරුවන් රුපියල් 25,000කට නොඅඩු අගය ඇති කොන්ත්‍රාත් සඳහා රජයේ දෙපාර්තමේන්තුවක් සමග හෝ රාජ්‍ය සංස්ථාවක් සමග හෝ ලේඛනාරූඪ අය විය යුතුයි.

සභාපති,
ලංකා වානේ සංස්ථාව,
අතුරුගිරිය.

8–347/2—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## පොළොන්නරුව සුළු නගර සභාවේ මුඩුක්කු සංහාරක නිවාස යෝජනා ක්‍රමය

පොළොන්නරුව සුළු නගර සභාවේ මුඩුක්කු සංහාරක නිවාස යෝජනා ක්‍රමයට අදාල ඒ. බී. සහ සී යන කොටස්වල එක කොට සක නිවාස පහ බැගින් නිවාස 15ක් සෑදීම සහ වතුර බොන ළිං දෙකක් සෑදීම ආදී කටයුතු සඳහා ඉහත සඳහන් පරිදි එක් කොටසක් වෙනුවෙන් පමණක් නම්, රජයේ දෙපාර්තමේන්තුවක රුපියල් 25,000ක් හෝ කොටස් දෙකක් හෝ තුනක් වෙනුවෙන් නම් රුපියල් 75,000ක් හෝ ඊට වැඩි ගණන් වලට ලියාපදිංචි වූ පළපුරුදු කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ ප්‍රදේශය තුළ පිහිටි සමූපකාර සමිති සංගම්වලින් පමණක්, 1965 අගෝස්තු මස 25 වැනි දින පෙරවරු 10 දක්වා පොළොන්නරුව සුළු නගර සභාවේ සභාපතිතුමා විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පෝර්ම ගාස්තු වශයෙන් රුපියල් 25ක් හා ටෙන්ඩර් ඇප මුදල වශයෙන් රුපියල් 200ක් ගෙවා යථොක්ත නගර සභා කාර්යාලයෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් පෝර්මවලින් පමණක් ටෙන්ඩර් ඉල්ලුම් කළ යුතුවේ.

ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලබන්නේ 1965 අගෝස්තු මස 24 වැනි දින පස්වරු 2.30 දක්වා පමණි. වැඩි විස්තර කාර්යාල වේලාවන්හිදී නගර සභාවේ ලේකම් මහතාගෙන් දැනගත හැක.

ඒ මිස් හපුආරච්චි,
සභාපති,
පොළොන්නරුව සුළු නගර සභාව.

1965 ජූලි මස 16 වැනි දින,
පොළොන්නරුව සුළු නගර සභා කාර්යාලයේදීය.

8–1419—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## කිරි මණ්ඩලය

1965.10.1 වැනි දින සිට 1966.9.30 වැනි දින දක්වා ඇති කාලය තුළදී, කොළඹ ප්‍රධාන කිරි සම්පාදන ස්ථානයේ නියුක්ත සේවක යින්ගේ නිල ඇඳුම් පිරිසිදු කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

කමිස, කොට කලිසම්, කය වැස්මයන් හා පෙර වැස්මයන් පිරිසිදු කළ යුතු දේවල්ය. නිල ඇඳුම් සතියකට දෙවරක් පිරිසිදු කළ යුතුයි.

ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, තැ. පෙ. 1155, කිරි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීට ලිපියකින් ඉදිරිපත් කළ යුතු අතර, කවරයෙහි වම් පස ඉහල කෙළවර "රෙදි පිරිසිදු කිරීම සඳහා ටෙන්ඩර" යනුවෙන් පැහැදිලිව සඳහන් කර 65.9.8 වැනි දින පස්වරු 3 ට පෙර මෙම කායඝ්ලයට ලැබෙන්නට සැලැස්විය යුතුයි.

මේ සඳහා වැඩි විස්තර නාරාහේන්පිට කොළඹ කිරි ක්‍රමයේ සම්පාදනාගාර අධිකාරිගෙන් ලබාගත හැක.

පිලික්ස් සෙනෙවිරත්න,
සාමාන්‍යාධිකාරී,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලයේ ප්‍රධාන කායඝ්ලය,
තැ. පෙ. 1155,
නාරාහේන්පිට, කොළඹ 5,
1965 අගෝස්තු 6 දා.

8–380—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

පොළොන්නරුව ලංගම ඩිපෝවේ ගොඩනැගිලි තැනීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය, ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1965 සැප්තැම්බර් මස 1 වෙනිදා පෙ. ව. 10.00 වන තෙක් බාරගනු ලැබේ. වැඩි විස්තර බොරලැස්ගමුවේ, වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන සිවිල් ඉංජිනේරු මහතා ගෙන් ලබාගත මැනවි.

රුපියල් 1,00,000 ක් හා ඊට වැඩියෙන් යන කර්මාන්ත සඳහා ලංගම සහ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් ලියාපදිංචි කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර පත්‍ර එවීමට සුදුස්සෝ වෙති. ඔවුන්ගේ සහතික පත්‍ර ආදිය ඉංජිනේරු මහතා අනුමත කළහොත්, ටෙන්ඩරකරුවා විසින් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා වෙත රු. 200ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ යුතුයි. තැන්පත් කළ මුදල වෙනුවෙන් ලැබුණ කුවිතාන්සිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු මහතාගේ කාර්යාලයයට ඉදිරිපත් කළ විට ඒ මහතා විසින් 1965 අගෝස්තු මස 28 වෙනිදා දවල් 12.00 වන තෙක් ටෙන්ඩර පෝර්ම කොළ දෙනවා ඇත.

ලංකා ගමනාගමන මණ්ඩලයෙන් සපයන ටෙන්ඩර පෝරමවල ලියා ඉදිරිපත් කරන ටෙන්ඩර පමණක් පිළිගනු ලැබේ.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1965 ක් අගෝස්තු මස 7 වෙනි දින,
කොළඹ 5, කිරුළ පාරේ,
200 වෙනි ස්ථානයේදීය.

8–393—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

ව්‍යාපාරික වාහනවලට විදුලි රඳන (බැටරි) සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනා ගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින්, 1965 ක් සැප්තැම්බර් මස 29 වෙනි දින පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්ම කොළවල ලියා අනුපිටපතකින් යුක්ත කොට එවිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම කොළ බොරලැස්ගමුවේ, වේරහැර පිහිටි ප්‍රධාන සම්පාදක නිලධාරි කායඝ්ලයෙන් 1965.9.28 වෙනි අඟහරුවාදා දවල් 12 වන තෙක් ලබා ගතහැක. ඒවා දෙනු ලබන්නේ, කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි කායඝ්ලයෙහි රු. 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් ගෙවා ඒ වෙනුවට ලැබුණ කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

ප්‍රධාන සම්පාදක නිලධාරි කායඝ්ලයෙන් වැඩි විස්තර දැනගත හැක.

ඇස්. ඇම්. එච්. පාරිස්,
ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනා ගමන මණ්ඩලය.

1965 අගෝස්තු මස 13 වෙනි දින දීය.

8–392—65.8.13 වැනි දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

## දැන්වීමයි

### ජාතික පෝෂකම් සංස්ථාව

සංස්ථාවේ, වේයන්ගොඩ ජිනිට් පහත සඳහන් ආපන ශාලා පවත්වා ගෙන යාම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් 1965 අගෝස්තු මස 27 වැනි දින පස්වරු 4.30 දක්වා බාරගනු ලැබේ.

(අ) නූල් කැටීමේ මෝලේ ආපන ශාලාව.
(ආ) විවීමේ මෝලේ ආපන ශාලාව.

ටෙන්ඩර් කරුවන්ට ආපන ශාලා දෙකටම හෝ ඉන් එකකට හෝ ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැක. තම ලිපිනය සහිත මුද්දර ඇලවූ ලියුම් කවරයක් එවීමෙන් හෝ පැමිණ හෝ වැඩි විස්තර හා ඉල්ලුම් පත් ලබාගත හැක.

බලාපොරොත්තුවන ටෙන්ඩර් කරුවන්ට වැඩ කරන වේලාවන් තුළදී ආපනශාලාවන් පරීක්ෂා කළ හැක.

ලේකම්,

ජාතික පෝෂකම් සංස්ථාව,
56, හෝර්ටන් පෙදෙස,
කොළඹ 7.

8–357—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය

### ගාල්ලේ සිමෙන්ති ඇඹරීමේ හා ඇසිරීමේ යන්ත්‍රාගාරය — නිවාස ක්‍රමය

1. ගාල්ලේ සිමෙන්ති ඇඹරීමේ හා ඇසිරීමේ යන්ත්‍රාගාරයේ නිවාස ක්‍රමයක් ඉදි කිරීම පිළිබඳ ටෙන්ඩර් ලේඛන සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් ලේඛන නිකුත් කොට, ටෙන්ඩර් භාරගනු ලබන්නේ—

(i) රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් වූත්,

(ii) මෙම ස්වභාවයේ වැඩ කිරීමට භාර ගැනීමේ සිය හැකියාව පිළිබඳව සංයුක්ත මණ්ඩලය සෑහීමට පත් කළ හැකි වූත් පිළිගත් කොන්ත්‍රාත්කාර සමාගම්වලින් පමණි.

3. ටෙන්ඩර් ලේඛන සඳහා අයදුම්පත් සමග—

(i) තමන් විසින් දැනට කර ඇති කොන්ත්‍රාත් පිළිබඳ විස්තර සහ

(ii) ආපසු ගෙවිය හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක්ද ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් භාර ගැනීම 1965 සැප්තැම්බර් 17 වැනි දින ප. ව. 2 ට අවසන් වෙයි. ටෙන්ඩර් ලේඛන සහ වෙනත් විස්තර සැලසුම් හා ඉදි කැරුම් අංශයෙන් ලබාගත හැකිය.

ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය,
තැ. පෙ. 1382,
287, ගාලු පාර,
කොළඹ 3.

ටැලිෆෝන් : 2375/76.
1965 ජූලි 12.

8–1290—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය—පුත්තලමේ සිමෙන්ති යෝජනා ක්‍රමය

### අනුපූරක සිවිල් ඉංජිනේරු වැඩ සඳහා ටෙන්ඩර්කරුවන්ගේ පූර්ව යෝග්‍යතා

1. පුත්තලම් යෝජනා ක්‍රමය පිළිබඳ අනුපූරක සිවිල් ඉංජිනේරු වැඩ සඳහා නොබෝ දිනකින් ටෙන්ඩර් කැඳවීමට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය අදහස් කරයි. මෙම ටෙන්ඩරයෙහි ලා අපේක්ෂා කැරෙනුයේ, පහතින් විස්තර කරනු ලබන සිවිල් ඉංජිනේරු වැඩය :

(i) **හුණුගල් පොඩි කිරීමේ හා එහා මෙහා කිරීමේ යන්ත්‍රාගාරය.**—පොඩි කරනයේ අත්තිවාරම්, ආධාරක කොටස්, පොළොව යට බක්කි, සහ සම්ප්‍රාපක ගැන්ට්‍රි යන සවි ගැන්වූ කොන්ක්‍රීට් වලින් නිම කළයුතු අංග ඇතුළු 40′ × 70′ පමණ වූ උඩ කොටස ඉදි කිරීම.

(ii) **මැටි සැකැසීමේ හා වියළීමේ යන්ත්‍රාගාරය.**—සවි ගැන්වූ කොන්ක්‍රීට් වලින් කළ බක්කි සහ වියළන අත්තිවාරම් ඇතුළු 40′ × 40′ × උස 60′ පමණ වූ උඩ කොටස. ඉදි කිරීම.

(iii) **අමු ද්‍රව්‍ය ඇඹරුම් යන්ත්‍රය.**—සවිගැන්වූ කොන්ක්‍රීට් වලින් නිම කළ ඇඹැරුම් හල අත්තිවාරම් සහ ආධාරක කොටස් ආදිය ඇතුලු 100′ × 40′ × උස135′ පමණ ඇඹරුම්හල ගොඩනැගිල්ල. සවි ගැන්වූ කොන්ක්‍රීට් වලින් ඉදි කරන 40′ × 40′ × උස160′ තාප විනිමය කාරක අටලුව.

(iv) **අමු කුඩු සයිලෝ යන්ත්‍රාගාරය.**—අමුකුඩු සඳහා විෂ්කම්භය 25′ × උස150′ පමණ සයිලෝ තුනක් සහ විෂ්කම්භය 40′ උස 100′ පමණ පෝරණු පෝෂක සයිලෝ එකක්—සියල්ලම සවි ගැන්වූ කොන්ක්‍රීට් වලින්.

(v) **භ්‍රමණ පෝරණු යන්ත්‍රාගාරය.**—සවි ගැන්වූ කොන්ක්‍රීට් වලින් නිම කරන භ්‍රමණ පෝරණු අත්තිවාරම්, ක්ලින්කර් සිසිල්කරනය ස්ථාපනය කිරීම සඳහා වළවල්, දහක පූවරුව ඇතුළු 45′ × 220′ × උස 70′ පමණවූ භ්‍රමණපෝරණු යන්ත්‍රාගාරයේ උඩ කොටස ඉදි කිරීම. පෝරණු ගෙයි වහලේ කොටස් වට්ටු වානේ වලිනි.

(vi) **අමු ද්‍රව්‍ය සහ ක්ලින්කර් ගබඩාව.**—සවිගැන්වූ කොන්ක්‍රීට් වලින් නිම කරන තාප්ප, කණු, බිම, වළවල් සහ අගල්ද ඇතුළුව 100′ × 700′ × උස 70′ අමු ද්‍රව්‍ය ගබඩා කිරීමේ ශාලාව. වහලේ කොටස් වට්ටු වානේ වලිනි.

(vii) **සිමෙන්ති ඇඹරුම් යන්ත්‍රය.**—සවිගැන්වූ කොන්ක්‍රීට් වලින් නිම කරන ඇඹරුම්හල අත්තිවාරම, බක්කි, සහ ආධාරක කොටස් ඇතුළු 40′ × 100′ × උස 75′ පමණවූ ඇඹරුම් හල ගොඩනැගිල්ල.

(viii) **සිමෙන්ති සයිලෝ.**—සවිගැන්වූ කොන්ක්‍රීට් වලින් විෂ්කම්භය 30′ × උස 100′ පමණ සයිලෝ හතරක්.

(ix) **ඇසුරුම් හල.**—සවිගැන්වූ කොන්ක්‍රීට් වලින් නිම කරන අත්තිවාරම්, බක්කි, සහ වළවල් ඇතුළුව, 40′ × 40′ × උස60′ පමණවූ උඩ කොටස ඉදි කිරීම.

(x) **උප විදුලි බලාගාරය.**—සවිගැන්වූ කොන්ක්‍රීට් වලින් නිම කරන අත්තිවාරම්, වළවල්, අගල් සහ තාප්ප ඇතුළුව 36′ × 100′ × උස 20′ පරිණාමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම.

(xi) **ජල සම්පාදන ක්‍රමය.**—සවිගැන්වූ කොන්ක්‍රීට් වලින් ගැලුම් 1,00,000 ධාරිතාව සහිත උසින් පිහිටි වතුර ටැංකියක් පොම්ප මඩුවක් සහ වතුර සිසිල් කිරීමේ පද්ධතියක් සඳහා බෙසම්, ඉදි කිරීම. සැතපුම් 3·5 ක පමණ විෂ්කම්භය 6″ක් වූ සී. අයි. නළමං සැපයීම හා දැමීම, සහ නළ පද්ධතිය සැපයීම හා ස්ථාපනය කිරීමත් ජලය ලබා ගන්නා ස්ථානයේ අනෙකුත් අපේක්ෂිත වැඩ කිරීමත්, ජල සම්පාදන ක්‍රමයට ඇතුළත් වෙයි.

2. යාන්ත්‍රික හා විදුලිය උපකරණ ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව දෙනු ලබනුයේ, අනුපූරක සිවිල් ඉංජිනේරු වැඩ සම්පූර්ණ කිරීම සමග ඒකාබද්ධ කළයුතු කාල උපලේඛනයක් පාදක කොට ගෙනය. කාල උපලේඛනයට අනුව අනුපූරක සිවිල් ඉංජිනේරු වැඩ සියල්ල සම්පූර්ණ කිරීමේ කාලය මාස 30 ක් විය යුතුය. එසේ වුවද, යාන්ත්‍රික සහ විදුලිය යන්ත්‍රාගාර ඉදි කිරීම සඳහා ඒකාබද්ධ කළ වැඩ සටහනට අනුව, සමහර වැඩ අංක පූර්වතා ක්‍රමයකට කල් තියා සම්පූර්ණ කළ යුතු වෙයි.

3. මෙම වැඩ සඳහා ටෙන්ඩර් කිරීමට අදහස් කරන සමාගම් පහත දැක්වෙන විස්තර ඉදිරිපත් කළ යුතුය.

(1) තමන් විසින් බාර ගන්නා ලද ප්‍රධානසිවිල් ඉංජිනේරු කොන්ත්‍රාත්තු වල වටිනාකම සහ ස්වභාවයත්, ඒ යෝජනා ක්‍රම සම්පූර්ණ කිරීම සඳහා ගත් කාලයත් දැක්වෙන ප්‍රකාශයක්.

(2) අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද ඉහතින් අංක 1 යටතේ සඳහන් කළ ගොඩනැගිලි යෝජනා ක්‍රම වලදී භාවිත කැරුණු ගොඩ නැගිලි උපකරණ ලැයිස්තුවක්—එක් එක් උපකරණයේ ධාරිතාවද සමග.

(3) මෙම ටෙන්ඩරයේ අපේක්ෂිත වැඩ ඉටු කිරීම සහ පරිපාලනයද බාර ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු කාර්ය මණ්ඩලය ඇතුළුව, ඉදි කිරීමේ වැඩ සඳහා යෙදවිය හැකි කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර.

(4) බැංකු යොමු.

ඉහත සඳහන් විස්තර 1965 සැප්තැම්බර් 3 වැනි සිකුරාදා ප.ව. 2ට පෙර ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

4. මේ සම්බන්ධයෙන් වෙනත් විස්තර යමක් අවශ්‍ය නම්, කොළඹ 3, ගාලු පාරේ, අංක 287 දරන ස්ථානයේ (තැ.පෙ. 1382) ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයේ සැලසුම් හා ඉදි කැරුම් අංශයෙන් ලබාගත හැකිය.

ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය,
තැ. පෙ. 1382,
287, ගාලුපාර,
කොළඹ 3.

ටැලිෆෝන් 2375/76,
1965 ජූලි 15.

8-1291—65.8.13 වැනි දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම

### සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**රාජකීය ලංකා නාවික හමුදාව**

1965 අගෝස්තු මස 30 වැනි සඳුදා පූ. භා. 9 ට ත්‍රිකුණාමලයේ පිහිටි රාජකීය ලංකා නාවික ආයතනයේදී, සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. විකුණනු ලබන විෂයයන් එදින පූ. භා. 8 සිට පරීක්ෂා කළ හැකිය.

වෙන්දේසිය අවසානයේදී සම්පූර්ණ මුදල ගෙවීමට අවශ්‍ය වේ. මිලදී ගත් විෂයයන් 1965.9.1 දින සවස 4ට පෙර ඉවත් කර ගතයුතු වේ.

ආර්. කදිර්ගාමර්,
නාවික හමුදපති.

8-266—65.8.13 වැනිදින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

---

### කැලෑ දෙපාර්තමේන්තුවේ දැව දඬු වෙන්දේසිය

කැලෑ දෙපාර්තමේන්තුවේ වවුනියාවේ දිශාභාර කැලෑ නිලධාරී විසින් මාන්කුලම දැව ගබඩාවේ ඇති I, II සහ III පන්තියේ කඳන් 158 ක්ද (ඝණ අඩි 1565.3 පමණ) I පන්තියේ ඉරූ ලී කෑබලි 11 සහ පරාල 30 ක්ද, 65.8.24 දින පස්වරු 2 ට දැව තිබෙන ස්ථානයේදී ප්‍රසිඩ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේදී දැව ඉල්ලුම් කිරීමට අදහස් කරණ අය වෙන්දේසි අවස්ථාවේදී කියවනු ලබන කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩිදුරටත් විස්තර අවශ්‍ය අයට වවුනියාවේ දිශා වන නිලධාරී තැනගේ කායාණීලයෙන් හෝ ඕළුමබු අඩවි වන නිලධාරීතැනගෙන් ලබාගත හැක.

සී. දිසානායක,
වවුනියාවේ දිශා භාර කැලෑ නිලධාරී.

දිශා භාර කැලෑ කාර්යාලය,
වවුනියාව, 65.8.4 දිනදී.

8-369—65.8.13 වැනි දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

---

### රේගු වෙන්දේසියක්

පහත සඳහන් භාණ්ඩ කොළඹ රේගු දෙපාර්තමේන්තුවේ කොච්චිකඩේ ගුදමේ 1965 අගෝස්තු මස 20 වෙනි සිකුරාදා උදේ 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

රෙදිපිළි, යකඩ බඩු, විදුලි භාණ්ඩ, මෝටර් රථ ටයර් සහ ටියුබ්. සහ අනිකුත් භාණ්ඩ රාශියක්.

ඉහත සඳහන් ස්ථානයේදී මෙම භාණ්ඩ පරීක්ෂා කිරීමට පුළුවන.

අංකය : ඒඩී/සේල්ස්/65/12.
1965 අගෝස්තු 6 දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

බී. ඉ. ගුණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

8-381—65.8.13 වැනි දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

---

### කැලෑ දෙපාර්තමේන්තුවේ දැව වෙන්දේසියේ විකිණීම

පුලියන්කුලම රජයේ දැව ගබඩාවේ ඇති විශේෂ, 1, 2 හා 3 වැනි පංතියේ ඝන අඩි 527.5 පමණ ඇති ඉරූ ලී කෑලි 968 ක් හා 2 වැනි පංතියේ කඳන් එකක් (ඝන අඩි 45.9 පමණ) ඉහත සඳහන් ස්ථානයේදීම 1965 අගෝස්තු 24 දින උදය 10ට වවුනියාවේ දිශා භාර කැලෑ නිලධාරී විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසි කිරීමට පෙර පරීක්ෂාකර බැලිය හැක. වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන මගෙන් හෝ පුලියන්කුලම රජයේ දැව ගබඩාවේ සහකාර ගබඩා පාලක ගෙන් ලබාගත හැක.

සී. දිසානායක,
වවුනියාවේ දිශා භාර වන නිලධාරී.

1965.7.24 දින,
වවුනියාවේ දිශා කැලෑ කායාණීලයේ දීය.

8-370—65.8.13 වැනි දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

### කලෑ දෙපාර්තමේන්තුවේ වෙන්දේසි කිරීම

පහත උපලේඛනයේ සඳහන් බුරුත, හල්මිල්ල, රානි, පලු යන I හා II පන්තීන්ට අයත් කඳන් හා ඉරන ලද දැවද වන අපරාධයනට අයත් කියතක්ද මෙහි දක්වා ඇති දිනයන්හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර මගෙන් හෝ ඒ ඒ අඩවි වන නිලධාරීන්ගෙන් හෝ පැමිණ ලබාගත හැක.

ජ. ආ. ද සිල්වා
දිසා වන නිලධාරි (උ.මැ.දී.)

1965, අගෝස්තු මස 8 වෙනි දින,
ත්‍රිකුණාමලයේ, දිසා වන කායාණීලයේදීය.

#### උපලේඛනය

| වෙන්දේසි කරන ස්ථානය | තොග ගණන | දිනය හා වේලාව |
|---|---|---|
| 1. අඩවි කැලෑ කායාණීලය, පොලොන්නරුව | කඳන් හා ඉරූ දැව තොග 9යි ඝ.අ. 184.5, මාංගු තොග1, කියත් 1යි. | 65.8.30 පෙ.ව.10 |
| 2. අඩවි කැලෑ කායාණීලය, අනුරාධපුරය | කඳන් තොග 1යි, ඝ.අ. 1335.0 | 65.9.[illegible] පෙ.ව.10 |

8-371—65.8.13 වැනි දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

## වෙන්දේසියේ විකිණීමයි

පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි බඩු 1965 අගෝස්තු 20 වැනි සිකුරාදා සවස 2 ට මෙම කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වනු ලැබේ :—

යකඩ කෑලි (ස්ක්‍රැප් අයර්න්) තොග 3 යි.
යකඩ දැල් තොග 1 යි.
පිල්ල සහ පහළ නළ තොග 1 යි.
රට අඹ ලෑලි තොග වශයෙන්.
ටින් ලයිනින්ස් තොග 1 යි.
යකඩ ටින් (අයර්න් ටින්) තොග 1 යි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 අගෝස්තු මස 9 වැනි දින,
කොළඹ 8,
ආණ්ඩුවේ මුද්‍රණාලයේදී ය.

8-451—65.8.13 වෙනි දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## කළුතර දිස්ත්‍රික්කයේ ඇල රේන්ද විකිණීම

1965 ඔක්තෝබර් මස 1 වෙනිදා සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනිදා තෙක් පහත සඳහන් ඇල වෙනුවෙන් රේන්ද ගාස්තු අය කිරීමේ සහ එකතු කිරීමේ තනි අයිතිවාසිකම් මිලට ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර කලුතර ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් කලුතර කච්චේරියේදී 1965 සැප්තැම්බර් මස 3 වෙනි දින පෙරවරු 10 ට භාර ගන්නා බැව් දන්වමි.

කැසූ ඇල පිහිටි කලුතර පරණ ඇල සහ ගල්තුඩේ පිහිටි ඇල එක් රේන්ද පලකදී එකම දිනක් ඇතුළත රේන්ද ගාස්තු අය කිරීමෙන් අනිකුත් රේන්ද ගාස්තු ගෙවීම්වලින් නිදහස් වනු ඇත. හතර මෝදර පිහිටි අලුත් ඇල.

2. එක් එක් ටෙන්ඩර් පත්‍රය ලියුම් කවරයක බහා සීල්/මුද්‍රා තබා, ඒ ලියුම් කවරයේ ඉහල වම් කෙලවරෙහි "කලුතර දිස්ත්‍රික්කයේ 1965-66 ඇල රේන්ද පිළිබඳ ටෙන්ඩර් පත්‍රය" යන්න සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර 1965 සැප්තැම්බර් මස 3 වෙනි දින පෙරවරු 10 ට කලින් කලුතර ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබිය යුතුයි. යටකී දින යටකී වේලාවේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට කලුතර කච්චේරියට අවුත් සිටිය හැකිය.

3. පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා ඇල රේන්ද විකුණන දිනයේදී එනම්, 1965.9.3 වෙනි දින ගැනුම් මුදලෙන් තුනෙන් පංගුවක් එවේලේම කච්චේරියෙහි මුදලෙන් තැන්පත් කොට රේන්ද විකුණුම් කොන්දේසි පත්‍රය අත්සන් කළ යුතුය.

4. රු. 50 ක් තැන්පත් කළ බවට කච්චේරියකින් ලබාගත් කුවිතාන්සියක් එක් එක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතු බවද, පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා එයට නියමිත කොන්දේසි පත්‍ර අත්සන් නොකර රේන්දයට ගෙවිය යුතු ඉහත සඳහන් නියමිත ඇප මුදල එවේලේම කච්චේරියේම තැන්පත් කිරීමට නොහැකි වුවහොත් ඔහු විසින් ටෙන්ඩර් පත්‍රය ගැනීම සඳහා තැන්පත් කරන ලද රු. 50 රාජසන්තක කිරීම සහ ඔහුට ඉන්පසු ආණ්ඩුවේ කොන්ත්‍රාත් ගැනීම අහිමි කිරීමට ක්‍රියා කරනු ලැබේ. පත් කරන ලද ටෙන්ඩර්කරු ගිවිසුම්පත අත්සන් කලාට පසු තැන්පත් කළ රු. 50 ඒ ඒ ටෙන්ඩර්කරුවන්ට ආපසු ගෙවනු ලැබේ.

5. කිසි හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලක්ම හෝ ප්‍රතික්ෂෙප කිරීමේ බලය කලුතර ආණ්ඩුවේ ඒජන්ත තැනටම තබාගෙන ඇත්තේ ය.

6. මේ පිළිබඳ වැඩි විස්තර කලුතර කච්චේරියෙන් දැන ගත හැක.

පී. කාසිලිංගම්,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන.

1965 අගෝස්තු මස 3 වැනි දින,
කලුතර දිසාපති කාර්යාලයේදීය.

8–283—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

අංකය : ඒ. එක්ස්. 4203

## අරක්කු රේන්ද විකිණීම—කොළඹ දිස්ත්‍රික්කය—1965–66

1965 ඔක්තෝබර් 1 දින සිට 1966 සැප්තැම්බර් 30 දින දක්වා තනි අයිතිය පිට පහත පෙනෙන කොන්දේසිවලට යටත්ව මතු දක්වෙන අරක්කු තැබෑරුම් වල සිල්ලරට අරක්කු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.—

(1) 1965 මැයි 28 දින අංක 14,407 දරන රජයේ ගැසට් පත්‍රයේ දක්වෙන අරක්කු රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි,

(2) සුරාබදු බලපත්‍ර සම්බන්ධ දනට වලංගුව පවතින පොදු කොන්දේසි ද ඇතුළත්ය.

2. පහත දක්වෙන කාර්යාලයන්ගෙන් ලබාගත හැකි නියමිත පෝර්ම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ පහත දක්වෙන (එච්) තීරයේ දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් සමගය :—

(ඒ) ඕනෑම කච්චේරියකින්,

(බී) සුරාබදු කොමසාරිස්තුමාගේ කාර්යාලය, කොළඹ 6,

(සී) කොළඹ සුරාබදු මණ්ඩල කාර්යාලය,

(ඩී) කළුතර සුරාබදු මණ්ඩල කාර්යාලය,

(ඊ) හලාවත සුරාබදු මණ්ඩල කාර්යාලය.

ලංකා පුරවැසියන් නොවූ කිසිම කෙනෙකුගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ. (ඉහත කී අරක්කු රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි 6 (1) (ඒ) බලන්න).

3. මුද්‍රාව තැබූ කවරයක බහන ලද එක් එක් ටෙන්ඩර්පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුය : " කොළඹ දිස්ත්‍රික්කයේ 1965-66 වර්ෂ අංක——දරණ අරක්කු තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය."...........ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයන් සහ පහත දක්වෙන නියමිත වේලාවලදී හෝ ඊට පෙර කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමාට ලැබෙන සේ එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවේ දී කොළඹ කච්චේරියට පැමිණිය යුතුයි.

4. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දනුම් දෙනු ලබන අතර, විකිණීම සඳහා කොන්දේසි අත්සන් කිරීමට අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි අනුව 9 (1) (ඒ) කොන්දේසි යටතේ නියමිත තැන්පත් ඇප මුදල ආණ්ඩුවේ ඒජන්ත තුමාට ගෙවිය යුතුයි.

5. මිලයට ගන්නා හැටියට වරප්‍රසාදය ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අපොහොසත්වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර, වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නටද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන්, සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් කළ මුදල් ආපසු දීම සහ ඉහතකී සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ද ආපසු ගෙවනු ලැබේ.

6. කිසි කරුණක් නොදක්වාම එකක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත තුමාට තිබේ.

7. තැබෑරුම් භාරගත් අය විසින් තැබිය යුතු ඇපය පොළීපිට ණය දෙන ලංකාණ්ඩුවේ (පොළියට ණය දෙන යුද්ධ ණය මුදල්ද ඇතුළුව) ඕනෑම පොරොන්දු පත්‍රයක මාර්ගයෙන් ඉදිරිපත් කළ හැකිය. මේ ණය මුදල්වලට බැංකුවල ස්ථිර තැන්පත් මුදල්වලටත් වඩා වැඩි පොළියක් ගෙවන අතර, රජය මගින් අර්ධ–වර්ෂ වශයෙන් පොළී ගණන් බලා මුදල් හිමියාට ගෙවනු ලැබේ. රේන්ද කාලය අවසන්වූ පසු එය ආපසු ලබාගත හැකිවාක් මෙන්ම

එය ඊට පසු රජයේ ටෙන්ඩර් කිරීමේ රේන්දයක් හෝ ගිවිසුමක් සඳහා ඇපය වශයෙන් එම සහතික ඉදිරිපත් කළ හැකි අතර, ඔහුගේ වෙන රේන්දයක් හෝ ගිවිසුමක් රජය සමග නොමැති නම් එම සහතිකවල වටිනාකම කිසිත් අපහසුවක් නොමැතිව ලෙහෙසියෙන්ම ආපසු ලබාගත හැක. බැංකුද මේ සහතික වැඩිමනත් ගැනීමේ ඇප වශයෙන් බාරගනු ලැබේ.

8. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලා යැවීමෙන් ලබාගත හැක.

ඩබ්ලිව්. ඩී. ඩී. මහතන්තිල,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

කොළඹ කච්චේරිය,
1965 අගෝස්තු මස 6 වෙනි දින

**කොළඹ දිස්ත්‍රික්කය**

ඉහත දක්වූ අනුමත කළ තැබෑරුම් ලැයිස්තුව

**රේන්ද ප්‍රදේශය—කොළඹ නාගරික සභාව**

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එෆ්) තැබෑරුම් විවෘත කරන වේලාව | (ජී) තැබෑරුම් වසන වේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 1 ... | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට: කොලේජ්වීදියේ දකුණු පෙදෙස, අළුත් මාවත පාර සහ කොටහේන වීදියේ සන්දියේ සිට වූ පෙදෙස ; නැගෙනහිරට : කොටහේන වීදියේ බටහිර පෙදෙසේ සිට කොලේජ් වීදියේ සන්ධිය දක්වා වූ පෙදෙස, උතුරු ස්කිනර් පාරේ පළමු කී සන්ධිය දක්වා වූ පෙදෙස; දකුණට: උතුරු ස්කිනර් පාරේ කොලේජ් වීදියේ සහ උතුරු ස්කිනර් පාරේ දකුණ පෙදෙසේ සන්ධිය දක්වා වූ පෙදෙස සහ එහි සන්ධියේ සිට කෝටබෝන් වීදියේ සන්ධිය දක්වා වූ පෙදෙස; බටහිරට: අලුත් මාවත පාරේ සහ උතුරු ස්කිනර් පාරේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට කොටබෝන් වීදියේ නැගෙනහිර පෙදෙස සහ කොලේජ් වීදියේ කෝටබෝන් වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට අළුත් මාවත පාරේ නැගෙනහිර පෙදෙස | 65.9.8 ... | පෙ.ව.10.00 ... | පෙ.ව.8.00 ... | ෂ.ව.7.00 ... | රු. 5,000 |
| 2 ... | නො. 5 කොට්ඨාශය, කොටහේන බටහිර | පෙදෙස මෙසේ සීමා වී තිබේ:—උතුරට: ලැස්කරින් වීදියේ සහ කෝට්බෝන් වීදියේ සන්ධිය දක්වාද එම සන්ධියේ සිට උතුරු ස්කිනර් පාරේ දකුණු පෙදෙස; නැගෙනහිරට; ජම්පටා වීදියේ සහ උතුරු ස්කිනර් පාරේ සන්ධිය දක්වා සහ එම සන්ධියේ සිට ලැස්කරින් වීදියේ බටහිර පෙදෙස ; දකුණට : කෝටබෝන් වීදියේ සහ ලැස්කරින් වීදියේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස ; බටහිරට : උතුරු ස්කිනර් පාරේ සහ ජම්පටා වීදියේ සන්ධිය දක්වා සහ | 65.9.8 ... | පෙ.ව.11.00 ... | පෙ.ව.8.00 ... | ප.ව.7.00 ... | රු. 5,000 |
| 3 ... | නො. 2 කොට්ඨාශය, මෝදර | පෙදෙස මෙසේ සීමා වී තිබේ:—උතුරට: මෝදර වීදියේ සන්ධියේ සිට වෙරළාසන්න පෙදෙස සහ එම සන්ධියේ සිට ටෙම්පල් පාරේ දකුණු පෙදෙස ද, අළුත් මාවත පාර සහ මෝදර වීදියේ සන්ධිය දක්වාද, එහි සිට මාදම්පිටිය පාරේ දකුණු පෙදෙස; නැගෙනහිරට: මාෂල් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වාද, එහි සිට අලුත්මාවත පාරේ බටහිර පෙදෙස ; දකුණට : වෙරළාසන්න පෙදෙසේ සිට අලුත් මාවත පාරේ සන්ධිය දක්වා සහ එහි සිට මාෂල් වීදියේ උතුරු පෙදෙස ද. බටහිරට: මාෂල් වීදිය සහ ටෙම්පල් පාර අතර වූ වෙරළාසන්න කොටස ද වෙත්. | 65.9.8 | ...දවල් 12.00 ... | පෙ.ව.8.00 ... | ප.ව. 7.00 ... | රු. 4,000 |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එෆ්) තැබෑරුම් විවෘත කරන වේලාව | (ජී) තැබෑරුම් වසන වේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 4 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට: නාගලගම් වීදියේ සහ ලූකස් පාරේ සන්ධියදක්වා,එම සන්ධියේ සිට පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙස; නැගෙනහිරට: මදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වා, එම සන්ධියේ සිට නාගලගම් වීදියේ බටහිර පෙදෙස ; දකුණට : ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ සන්ධිය දක්වා පෙදෙස, එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙස;බටහිරට: මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වා පෙදෙස, එම සන්ධියේ ලූකස් පාරේ නැගෙනහිර පෙදෙස ද වෙත්. | 65.9.8 | ...ප.ව. 2.00 | ...පෙ.ව.8.00 | ...ප.ව. 7.00 ... | රු. 5,000 |
| 5 ... | නො. 3 කොට්ඨාශය, මාදම්පිටිය | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—උතුරට: ගහ දක්වාවූ මට්ටක්කුලිය පල්ලිය පාරේ පෙදෙස සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධියේ සිට වූ පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙස ; නැගෙනහිරට : මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්ධිය දක්වා වූ පෙදෙස, සහ එම සන්ධියේ සිට ලූකස් පාරේ බටහිර පෙදෙස ; දකුණට : දනියෙල් පාරේ සහ ලූකස් පාරේ සන්ධිය දක්වා පෙදෙස සහ එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙස ; බටහිරට : හීනමුල්ල පටුමගේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා පෙදෙස සහ එම සන්ධියේ සිට දනියෙල් පාරේ නැගෙනහිර පෙදෙස ද වෙත්. | 65.9.8 | ...ප.ව. 3.00 | ...පෙ.ව.8.00 | ...ප.ව. 7.00 ... | රු. 4,000 |
| 6 ... | නො. 27, කොට්ඨාශය, බම්බලපිටිය | පෙදෙස මෙසේ සීමාවී තිබේ:—ස්කූල් පටුමගේ සහ කොල්ලුපිටිය පටුමගේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට ගාලුපාරේ නැගෙනහිර පෙදෙස දක්වා සහ සාන්ති කිල්වා පටුමගේ ද 14 වෙනි පටුමගේද සන්ධිය දක්වා එම සන්ධියේ සිට ගාලුපාරේ බටහිර පෙදෙස ද වෙත්. | 65.9.8 | ...ප.ව. 4.00 | ...පෙ.ව.8.00 | ...ප.ව. 7.00 ... | රු. 5,000 |

කොළඹ දිස්ත්‍රික්කය (නාගරිකයෙන් පිටත)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 7 ... | උතුරු අලුත්කුරුකෝරළේ (ඒ)... | උඩියාර් තෝප්පු... ... | 65.9.9 | ...පෙ.ව.10.00 | ...පෙ.ව.10.00 | ...ප.ව. 9.00 ... | රු. 4,000 |
| 8 ... | එම ... | කුඩාපාඩුව ... ... | එම | ...පෙ.ව.10.30 | ...පෙ.ව.10.00 | ...ප.ව. 9.00 ... | රු. 500 |
| 9 ... | එම ... | පෙරියමුල්ල ... ... | එම | ...පෙ.ව.11.00 | ...පෙ.ව.10.00 | ...ප.ව. 9.00 ... | රු. 2,000 |
| 10 ... | එම ... | බෝලවලාන ... ... | එම | ...පෙ.ව.11.30 | ...පෙ.ව.10.00 | ...ප.ව. 9.00 ... | රු. 2,500 |
| 11 ... | එම ... | පිටිපන ... ... | එම | ...දවල් 12.00 | ...පෙ.ව.8.00 | ...ප.ව. 7.00 ... | රු. 1,000 |
| 12 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) ... | කුරණ ... ... | එම | ...ප.ව. 2.00 | ...පෙ.ව.10.00 | ...ප.ව. 9.00 ... | රු. 2,000 |
| 13 ... | උතුරු අළුත්කුරු කෝරළේ (බී)... | දගොන්න ... ... | එම | ...ප.ව. 2.30 | ...පෙ.ව.8.00 | ...ප.ව. 7.00 ... | රු. 500 |
| 14 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ)... | කටුනායක ... ... | 65.9.9 | ...ප.ව. 3.00 | ...පෙ.ව.8.00 | ...ප.ව. 7.00 ... | රු. 2,000 |
| 15 ... | එම ... | හේනමුල්ල ... ... | එම | ...ප.ව. 3.30 ... | එම ... | එම ... | රු. 250 |
| 16 ... | එම ... | ඇත්ගාල ... ... | එම | ...ප.ව. 4.00 ... | එම ... | එම ... | රු. 250 |
| 17 ... | එම ... | කඳවල ... ... | 65.9.13 | ...පෙ.ව.10.00... | එම ... | එම ... | රු. 500 |
| 18 ... | එම ... | දළුවකොටුව ... ... | එම | ...පෙ.ව.10.30... | එම ... | එම ... | රු. 500 |
| 19 ... | එම ... | කොච්චිකඩේ ... ... | එම | ...පෙ.ව.11.00... | එම ... | එම ... | රු. 1,000 |
| 20 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) සහ දකුණු අළුත්කුරු කෝරළේ ... | කැපුන්ගොඩ ... ... | එම | ...පෙ.ව.11.30... | එම ... | එම ... | රු. 500 |
| 21 ... | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ)... | සීදූව ... ... | එම | ...දවල් 12.00 ... | එම ... | එම ... | රු. 2,000 |
| 22 ... | දකුණු අළුත්කුරු කෝරළේ ... | බෝපිටිය ... ... | එම | ...ප.ව. 2.00 ... | එම ... | එම ... | රු. 1,000 |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එෆ්) තැබෑරුම් විවෘත කරන වේලාව | (ජී) තැබෑරුම් වසන වේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල |
|---|---|---|---|---|---|---|---|
| 23 | දකුණු අළුත්කුරු කෝරළේ | දඩුගම | 65.9.13 | ප.ව. 2.30 | පෙ.ව. 8.00 | ප.ව. 7.00 | රු. 2,000 |
| 24 | එම | කනුවන | එම | ප.ව. 3.00 | පෙ.ව.9.00 | ප.ව. 8.00 | රු. 3,000 |
| 25 | එම | වැලිගම්පිටිය | එම | ප.ව. 3.30 | එම | එම | රු. 2,000 |
| 26 | එම | කඳාන | එම | ප.ව. 4.00 | එම | ප.ව. 9.00 | රු. 2,500 |
| 27 | එම | කෙරගෙපොකුණ | 65.9.14 | පෙ.ව.10.00 | එම | එම | රු. 2,500 |
| 28 | එම | තිඹිරිගස්යාය | එම | පෙ.ව.10.30 | එම | ප.ව. 8.00 | රු. 2,500 |
| 29 | එම | උස්වැටකෙයියාව | එම | පෙ.ව.11.00 | පෙ.ව 8.00 | ප.ව. 7.00 | රු. 500 |
| 30 | නො. 9, කොට්ඨාශය, මොරටුව පළාත් ආණ්ඩු සභාව | මොරටුව පළාත් ආණ්ඩු සභාවේ නො. 9 කොට්ඨාශයේ දිගරොල්ල ගමේ පමණක් | එම | පෙ.ව.11.30 | පෙ.ව.9.00 | ප.ව. 9.00 | රු. 5,000 |
| 31 | බටහිර සියනෑ කෝරළේ (අ.ප.) | නුවර පාරෙන් හැරී යාර 400 කට නොඅඩු දුරින් කඩවත–රාගම පාරේ දෙපස පිහිටි කරගහමුනේ පළාත ගමේ පමණක් | එම | දවල් 12,00 | පෙ.ව.8.00 | ප.ව. 7.00 | රු. 3,000 |

කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නාගරිකයෙන් පිට එක් එක් තැබෑරුමට කෙළින් දී තිබෙන අනුක්‍රමික අංක ප්‍රදේශ හා ප්‍රාදේශීය ප්‍රදේශ ගැන ටෙන්ඩර් කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

### අරක්කු තැබෑරුම්—කොළඹ දිස්ත්‍රික්කය (නාගරිකයෙන් පිට)

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත්විය යුතු පෙදෙස) |
|---|---|---|
| 7 | මීගමු නාගරික සභාවේ නො. 8 කොට්ඨාශය | මීගමු නාගරිකයෙහි කුන්ඩන්විල, නො. 8 කොට්ඨාශයේ උඩයාරේ තෝප්පු ගමේ පමණක් |
| 8 | මීගමු නාගරික සභාවේ නො. 4 කොට්ඨාශය | මීගමු නාගරිකයෙහි වැල්ල වීදියේ නො. 4 කොට්ඨාශයේ කුඩාපාඩුව ගමේ පමණක් |
| 9 | මීගමු නාගරික සභාවේ නො. 5 කොට්ඨාශය | මීගමු නාගරිකයෙහි කුඩාපාඩුව නො. 5 කොට්ඨාශයේ පෙරියමුල්ල ගමේ පමණක් |
| 10 | මීගමු නාගරික සභාවේ නො. 10 කොට්ඨාශය | මීගමු නාගරිකයේ ග්‍රෑන්ඩ් වීදියේ නො. 10 කොට්ඨාශයේ බෝලවලාන ගමේ පමණක් |
| 11 | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | පිටිපන ගමේ පමණක් |
| 12 | මීගමු නාගරික සභාවේ නො. 11 කොට්ඨාශය | මීගමු නාගරිකයේ කුරණ බෝලවලාන නො 11 කොට්ඨාශයේ කුරණ ගමේ පමණක් |
| 13 | උතුරු අළුත්කුරු කෝරළේ (බී) | දංගොන්න ගමේ පමණක් |
| 14 | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | කටුනායක ගමේ පමණක් |
| 15 | එම | හේනමුල්ල ගමේ පමණක් |
| 16 | එම | ඇත්ගාල ගමේ පමණක් |
| 17 | එම | කඳවල ගමේ පමණක් |
| 18 | එම | දළුවකොටුව ගමේ පමණක් |
| 19 | කොච්චිකඩේ සුළු නගර සභාවේ නො. 3 කොට්ඨාශය | කොච්චිකඩේ සුළු නගර සභා ප්‍රදේශ නො. 3 කොට්ඨාශය තුළ පමණක් |
| 20 | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) සහ දකුණු අළුත්කුරු කෝරළේ | කැපුන්ගොඩ ගමේ පමණක් |
| 21 | උතුරු අළුත්කුරු කෝරළේ (ඒ) | සීදූව ගමේ පමණක් |
| 22 | දකුණු අළුත්කුරු කෝරළේ | බෝපිටිය ගමේ පමණක් |
| 23 | එම | දඩුගම ගමේ පමණක් |
| 24 | ජාඇල පළාත් ආණ්ඩු සභාවේ නො. 1 කොට්ඨාශය | ජාඇල පළාත් ආණ්ඩු සභා ප්‍රාදේශයේ කනුවන උතුරු නො. 1 කොට්ඨාශයේ කනුවන ගමේ පමණක් |
| 25 | ජාඇල පළාත් ආණ්ඩු සභාවේ නො. 6 කොට්ඨාශය | ජාඇල පළාත් ආණ්ඩු සභා ප්‍රදේශයේ හෙට්ටිගම නො. 6 කොට්ඨාශයේ වැලිගම්පිටිය ගමේ පමණක් |
| 26 | කඳාන සුළු නගර සභාවේ නො. 2 කොට්ඨාශය | කඳාන සුළු නගර සභාවේ නො. 2 කොට්ඨාශයේ කඳාන ගමේ පමණක් |
| 27 | කඳාන සුළු නගර සභාවේ නො. 8 කොට්ඨාශය | කඳාන සුළු නගර සභාවේ නො. 8 කොට්ඨාශයේ කෙරගපොකුණ ගමේ පමණක් |
| 28 | හැඳල සුළු නගර සභාවේ නො. 4 කොට්ඨාශය | හැඳල සුළු නගර සභාවේ නො. 4 කොට්ඨාශයේ තිඹිරිගස්යාය ගමේ පමණක් |
| 29 | දකුණු අළුත්කුරු කෝරළේ | උස්වැටකෙයියාව ගමේ පමණක් |
| 30 | මොරටුව පළාත් ආණ්ඩු සභාවේ නො. 9 කොට්ඨාශය | මොරටුව පළාත් ආණ්ඩු සභාවේ ප්‍රදේශයේ නො. 9 කොට්ඨාශයේ දිගරොල්ල ගමේ පමණක් |
| 31 | බටහිර සියනෑ කෝරළේ (අ.ප.) | නුවර පාරෙන් හැරී යාර 400කට නොඅඩු දුරින් කඩවත–රාගම පාරේ දෙපස පිහිටි කරගහමුනේ පළාත ගමේ පමණක් |

8-342—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

## 1965–66 වර්ෂයට මඩකලපු දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම

වර්ෂ 1965 ඔක්තෝබර් 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් 30 වැනි දින දක්වා කාලය තුළ පහත දක්වෙන තැබෑරුම්වල අරක්කු සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර පහත දක්වෙන කොන්දේසි වලට යටත්ව භාර ගනු ලැබේ :—

(අ) 1965 මැයි 28 වැනි දින අංක 14,407 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනලද අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි; සහ

(ආ) 1965 මැයි 7 වැනි දින අංක 14,390 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 536 දරණ සුරාබදු නිවේදනයේ අඩංගු සියළුම සුරාබදු බලපත්‍රවලට අදාල පොදු කොන්දේසි.

2. එක් එක් තැබෑරුම සඳහා රු: 3,000ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුයි.

3. ලංකාවේ ඕනෑම කච්චේරියකින් හෝ කොළඹ සුරාබදු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ මහනුවර සහකාර සුරාබදු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ ත්‍රිකුණාමලේ සුරාබදු අධිකාරි තැනගේ කාර්යාලයෙන් හෝ ලබාගත් ආකෘති පත්‍රවල ලියන ලද ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි.

4. 1965 සැප්තැම්බර් 3 වැනි සිකුරාද මෙහි පහත දක්වා ඇති, ටෙන්ඩර් පත් බාර ගැනීම අවසන් වේලාවට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ. ටෙන්ඩර් පත් බාර ගැනීම අවසන් වන වේලාව වන විට සියළුම ටෙන්ඩර් කරුවන් මෙම කච්චේරියට පැමිණ සිටිය යුතුයි.

5. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මඩකළපුවේ කච්චේරියෙන් ලබාගත හැකිය.

ආර්. ජී. ජී. ඕ. ගුණසේකර,
වැඩ බලන මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති.

1965.8.7 වැනි දින,
මඩකලපුවේ කච්චේරියේදීය.

සඳහන් කරන ලද ප්‍රදේශ

රේන්ද ප්‍රදේශය—මඩකලපු දිස්ත්‍රික්කය

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම් පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොටස | ටෙන්ඩර්පත් බාර ගැනීම අවසන් කරන වේලාව |
|---|---|---|---|
| 1. | කොරලේ පත්තු ... | වාලචේනෙයි ග්‍රාමය තුළ | පෙ.ව. 10.00 |
| 2. | ඒරාවූර් සුළු නගරසභාව | ඒරාවූර් සුළු නගරසභා සීමාව තුළ | පෙ.ව. 11.00 |
| 3. | මඩකලපු පළාත් ආණ්ඩු සභාවේ අංක 6 දරණ කොට්ඨාශය ... | මඩකලපු පළාත් ආණ්ඩු සභාවේ අංක 6 දරණ කොට්ඨාශය වන කොට්ටමුනේ තුළ | දහවල් 12.00 |
| 4. | එරුවිල් පොරතිවු පත්තු | එරුවිල් ග්‍රාමය තුළ ... | ප.ව. 2.00 |

8–417/2—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

## 1965–66 වර්ෂයට මඩකලපු දිස්ත්‍රික්කයේ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම

විදේශීය මත්පැන් තැබෑරුම් බලපත්‍රයක් යටතේ 1965 ඔක්තෝබර් 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් 30 වැනි දින දක්වා වූ කාලය තුළ, මෙහි පහත දක්වෙන ප්‍රදේශයෙහි, මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති විසින් අනුමත කරන ලද ස්ථානයෙහි විකිණීමේ තනි අයිතිය මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පත් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව බාරගනු ලැබේ:—

(අ) 1964 ජුනි 26 දින අංක 14,080 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි, සහ

(ආ) 1965 මැයි 7 වැනි දින අංක 14,390 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 536 දරණ සුරාබදු නිවේදනයේ සඳහන් සියළුම සුරාබදු බලපත්‍රවලට අදාල පොදු කොන්දේසි.

2. රු. 500 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩර් පත්‍රයට අමුණා එවිය යුතුයි.

3. ලංකාවේ ඕනෑම කච්චේරියකින් හෝ කොළඹ සුරාබදු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ මහනුවර සහකාර සුරාබදු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ ත්‍රිකුණාමලේ සුරාබදු අධිකාරි තැනගේ කාර්යාලයෙන් හෝ ලබාගත ආකෘති පත්‍රවල ලියන ලද ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි.

4. 1965 සැප්තැම්බර් 3 වැනි සිකුරාද පස්වරු 3ට ටෙන්ඩර් පත් බාරගැනීම අවසන් කරනු ලැබේ. එම වේලාවට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම කච්චේරියට පැමිණ සිටිය යුතුයි.

5. මඩකළපු පළාත් ආණ්ඩු සභාවේ අංක 1 දරණ කොට්ඨාශයේ පුලියන්තිවුහි මෙම තැබෑරුම පිහිටුවිය යුතුයි.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මඩකළපුවේ කච්චේරියෙන් ලබාගත හැකිය.

ආර්. ජී. ජී. ඕ. ගුණසේකර,
වැඩ බලන මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති.

1965.8.7 වැනි දින,
මඩකලපුවේ කච්චේරියේදීය.

8–417/1—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### ගලගෙදර-මල් පොලයාවත්ත—නිවාස ක්‍රමය

ගලගෙදර ඡන්ද කොට්ඨාශය තුළ පිහිටි මල් පොලයාවත්ත ඉඩමේ නිවාස යෝජනා ක්‍රමයක් ඇති කිරීම සඳහා පර්චස් 15—16 ප්‍රමාණයේ නිවාස තැනීම පිණිස වෙන් කර ඇති ඉඩම් කැබලි 10ක් බෙදාදීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති විවාහක ලාංකික පුරවැසියන්ගෙන් ඉල් ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

(අ) තමන් ගේ සහ තමන් ගේ භාර්‍යාවගේ/පුරුෂයාගේ සම්පූර්ණ මාසික ආදායම රුපියල් 400 කට නොවැඩි අය.

(ආ) තමන් ගේ නමින් හෝ තමන් ගේ භාර්‍යාවගේ/පුරුෂයාගේ නමින් හෝ, තමන් ගෙන් යැපෙන දරුවෙකුගේ නමින් ගෙයක් හෝ ගෙයක් සෑදීම සඳහා ඉඩමක් නොමැති අය.

(ඇ) ගලගෙදර ඡන් ද කොට්ඨාශය තුළ අවුරුදු 5 කට නොඅඩු කාලයක් ස්ථිරව පදිංචිය ඇති හෝ එම කොට්ඨාශයන් හි ස්ථිර අයිතිවාසිකම් ඇති අය.

2. නියමිත සුදුසුකම් ඇති අයදුම්පත් වැඩි සංඛ්‍යාවක් ලැබුණහොත් ඉඩම් කැබැලි බෙදාදීම කරනු ලබන් නේ කුසපත් ඇදීමකින් පසුවය.

3. තමන් ට ලැබෙන ඉඩම් කැබැල් ලේ නියමිත කාලසීමාවක් ඇතුළතදී නිවාසයක් තැනීම සඳහා ණය මුදලක් දෙපාර්තමේන් තුම මගින් දෙන අතර, නිවසේ වැඩ අනුමත කළ සැලැස්ම සහ ඇස් තමේන් තුවට අනුකූලව නිමකළ යුතුය. වරක් අනුමත කළ සැලැස් ම වෙනස් කළ හැක් කේ මාගේ අවසරයකින් පසුවයි.

4. අවුරුදු 25 කින් ඉඩම් කැබැල් ලේ සහ නිවාස සෑදීම සඳහා දෙනු ලබන ණය මුදල ගෙවී යන පරිදි මාසික කුලිය රුපියල් 35 පමණ වන් නේ ය.

5. මෙම නිවේදනයේ තුන් වෙනි ඡේදයේ පරිදි නිවාස සාදා නිම කිරීම සඳහා කාලසීමාවක් දෙන අතර, එම කාලසීමාව අවසන් වනවාත් සමගම මාස දෙකක කුලිය තැන් පත් කර දෙපාර්තමේන්තුව සමග බඳු ගිවිසුමක් අත් සන් කිරීමෙන් පසුව නිවසේ පදිංචි විය හැක.

6. අනුමත කළ සැලැස් ම සහ ඇස් තමේන් තුව අනුව නිමකර ඇති වැඩ ප්‍රමාණයක් මැන ගණන් බලා ඊට සරිලන මුදලක් ඇස් තමේන් තු කර ඇති මුදල තෙක් ගෙවනු ලැබේ. එහෙත්, දෙපාර්තමේන් තුවෙන් පළමුවෙනි කොටස ගෙවීමට ප්‍රථමයෙන් නිවාසයන් හි වැඩ පටන් ගැනීම් සඳහා මූලික වියදමක් දැරීමට සිදුවනු ඇත. නිවාසවල වැඩ පටන් ගැනීමට පෙර දෙපාර්තමේන් තුවත් සමග කොන් ත්‍රාත් තුවක් අත් සන් කළ යුතුය.

7. ගෙයි පදිංචිකාරයාට ගෙයි හා ඉඩම් කැබැල් ලේ නීත්‍යානුකූල අයිතිය පැවරෙන් නේ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කළ පසුය. ගෙයි පදිංචිකාරයා යම්කිසි අවස්ථාවකදී ශේෂව තිබෙන මුදල එකතුවම ගෙවා දැමීමත් සමගම ගෙයි නීත්‍යානුකූල අයිතියත්, ඔහුට පවරා දෙනු ලැබේ. ගෙයි පදිංචියට ගියදා සිට පදිංචිකාරයා විසින් ම එය නඩත් තු කළයුතුවා පමණක් නොව, ගෙවල් කුලියද, වරිපනම් හා ඉවනත් ගාස් තුද ගෙවිය යුතු වේ.

8. ඉල් ලුම්පත්‍ර පිළියෙල කළ යුත් තේ පහත සඳහන් ස්ථානවලින් නොමිලේ ලබාගත හැකි විශේෂ ආකෘති පත්‍රවලය :—

(අ) මහනුවර, මධ්‍යම වෙළඳ හලේ පිහිටි මාගේ කාර්‍යාලය.

(ආ) මහනුවර ලේ කම් කාර්‍යාලය.

(ඇ) තුම්පනේ ගම්කාර්‍ය සභා කාර්යාලය.

9. පිළියෙල කරන ලද අයදුම්පත පහත පෙනෙන ලිපිනයට 65.9.4 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය :—

"ජාතික නිවාස සහකාර කොමසාරිස්, මධ්‍යම වෙළඳ හළ, මහනුවර".

10. ඉල් ලුම් පත්‍ර එවා දින 21 ක් ඇතුළතදී එය ලැබුන බවට දැන් වීමක් නොලැබුනහොත්, ඒ බැව් දන් වා තැපැල් කාර්‍යාලයේ ලියා පදිංචි කළ ලිපියකින් මා වෙත දැන් විය යුතුය.

සී. පී. වික්‍රමසිංහ,
ජාතික නිවාස සහකාර කොමසාරිස්.

8–1361—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි